# ප්‍රවෘත්ති

2018 ජනවාරි - මාර්තු

1 - 3 කලාපය




2 ඉන්දුනීසියාවේ සමාජ, ආර්ථික තොරතුරු බිඳක්

3 විනිමය පාලන පනතින් ඔබ්බට - නව විදේශ විනිමය පනත සහ ඒ යටතේ නිකුත් කරන ලද නියෝග සහ නියමයන් පිළිබඳව හැඳින්වීමක්

8 ආර්ථික සංවර්ධනය සඳහා ඉවහල් වන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය

17 ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය උදෙසා ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය




ISSN 1391-3697

01812

9 770041 001243


රු. 20/-


ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව




# ඉන්දුනීසියාව

## ඉන්දුනීසියාව සමාජ, ආර්ථික තොරතුරු බිඳක්...



| | |
|---|---|
| භූමි ප්‍රමාණය<br>මුළු ප්‍රමාණය<br>ගොඩ බිම් ප්‍රමාණය<br>අභ්‍යන්තර ජලාශ | <br>වර්ග කි.මී. 1,904,569<br>වර්ග කි.මී. 1,811,569<br>වර්ග කි.මී. 93,000 |
| ජනගහනය (2017 ජූලි ඇස්තමේන්තු) | 260,580,739 |
| ජනගහන වර්ධන වේගය (2017 ඇස්තමේන්තු) | 0.86% |
| උපත් අනුපාතය (2017 ඇස්තමේන්තු) (ජනගහනය දහසකට) | 16.2 |
| මරණ අනුපාතය (2017 ඇස්තමේන්තු) (ජනගහනය දහසකට) | 6.5 |
| උපතේදී ජීවිත අපේක්ෂාව (අවුරුදු) (2017 ඇස්තමේන්තු) | 73 |
| ළදරු මරණ අනුපාතය (2017 ඇස්තමේන්තු) (සජීවී උපත් දහසකට) | 22.7 |
| සේවා වියුක්තිය (2017 ඇස්තමේන්තු) | 5.4% |
| කුටුම්භ ආදායමේ ගිනි සංගුණකය (2009 ඇස්තමේන්තු) | 36.8 |
| ශ්‍රම බලකාය (2017 ඇස්තමේන්තු) | මිලියන 126,1 |
| දළ දේශීය නිෂ්පාදිතය (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් ට්‍රිලියන 3.243 |
| මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය (2017 ඇස්තමේන්තු) | 5.2% |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් 12,400 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය<br>කෘෂිකර්මය<br>කර්මාන්ත<br>සේවා (2017 ඇස්තමේන්තු) | <br>13.9%<br>40.3%<br>45.9% |
| අයවැය අතිරික්තය (+) හෝ හිඟය (-) දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස (2017 ඇස්තමේන්තු) | -2.4% |
| උද්ධමන අනුපාතය (2017 ඇස්තමේන්තු) | 4% |
| ආනයන (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 142.3 |
| ආනයන භාණ්ඩ | ඛනිජ තෙල්, බොයිලේරු, යන්ත්‍රෝපකරණ හා උපාංග, යකඩ සහ වානේ, ආහාර ද්‍රව්‍ය |
| අපනයන (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 157.8 |
| අපනයන භාණ්ඩ | ඛනිජ තෙල්, සත්ව හා ශාක මේදය (පාම් තෙල් ඇතුළුව) විද්‍යුත් යන්ත්‍රෝපකරණ, රබර්, යන්ත්‍රෝපකරණ කොටස් |

## ඉන්දුනීසියාව

ඉන්දුනීසියානු ජනරජය යන නිල නාමයෙන් හැඳින්වෙන ඉන්දියානු සහ ශාන්තිකර සාගර අතර පිහිටි ඒකීය ස්වෛරී රාජ්‍යයක් වන මෙය ලොව විශාලත ම දූපත් රාජ්‍යය වශයෙන් සැලකෙනවා. දූපත් දහතුන් දහසකින් පමණ සමන්විත ඉන්දුනීසියාව ගොඩබිමේ විශාලත්වය අතින් ලොව දහහතර වන ස්ථානයේ පසුවෙනවා. සාගර සහ ගොඩබිම් යන දෙක ම සැලකුවහොත් එය ලොව හත්වන විශාල ම රටයි. ලොව දෙවැනි ජනාකීර්ණ නාගරික ප්‍රදේශය වන ජකර්තා නගරය ඉන්දුනීසියාවේ අගනුවරයි. බොහෝ ජනාකීර්ණ ප්‍රදේශවලින් යුක්ත වුවත් ඉහළ ජෛව විවිධත්වයකින් යුත් සුවිසල් වනගහනයක් ඉන්දුනීසියාව සතුයි.

දිගු කලක් තිස්සේ චීන සහ ඉන්දීය රාජ්‍යයන් සමග වෙළෙඳ ගනුදෙනුවල යෙදුණු ඉන්දුනීසියාව සතු ස්වාභාවික සම්පත්වල බහුල බව නිසා ම ඉතිහාසය පුරා විදෙස් බලපෑම එයට එල්ල වුණා. පෘතුගීසි, ලන්දේසි, මුස්ලිම් බලපෑම් නිසා විවිධ ආගම් සහ සංස්කෘතිකාංග රාශියක් ඉන්දුනීසියානු ජන ජීවිතයට ඇතුළු වූ අතර විවිධ භාෂා කතා කරන, විවිධ ආගම් අදහන ජන වර්ග සිය ගණනක් අද මේ රටේ වාසය කරනවා.■

මූලාශ්‍ර - World Fact Book
Wikipedia විශ්වකෝෂය

"සටහන" සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

**2018 ජනවාරි මාසයේ සිට "සටහන" සඟරාව පළ වන්නේ තෙමසකට වරක් බව කරුණාවෙන් සලකන්න.**

සටහන

ශ්‍රී ලංකා මහ බැංකුව නමට ලියන ලද මුදල් ඇණවුම්/චෙක්පත් මෙහි සඳහන් ලිපිනයට එවීමෙන් "සටහන" තැපෑලෙන් ගෙන්වා ගත හැකි ය.

පිටපතක මිල : රු. 20.00
වාර්ෂික දායකත්වය : රු. 320.00
(තැපැල් ගාස්තු ද ඇතුළත්ව)

අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590, කොළඹ

# විනිමය පාලන පනතින් ඔබ්බට

## නව විදේශ විනිමය පනත සහ ඒ යටතේ නිකුත් කරන ලද නියෝග සහ නියමයන් පිළිබඳ ව හැඳින්වීමක්

**පවිත්‍රි විතානගේ**
**ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ**
**නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුව**

2017 නොවැම්බර් මස 20 වන දින සිට බල පැවැත්වෙන පරිදි 2017 අංක 12 දරන විදේශ විනිමය පනත ක්‍රියාත්මක වේ. එකී පනත, විදේශ විනිමය ප්‍රවර්ධනය සහ නියාමනය පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා ද ඒ පිළිබඳ වගකීම රජයේ නියෝජිත වශයෙන් මහ බැංකුවට පැවරීම සඳහා ද 1953 අංක 27 දරන විනිමය පාලන පනත ඉවත් කිරීම සඳහා හා ඒ සම්බන්ධ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි. විදේශ විනිමය පනතෙහි විශේෂ කරුණු කෙටියෙන් විමසා බලමු.

### 1. විදේශ විනිමය හා සම්බන්ධ ව සේවා සපයන්නන් පුළුල් කිරීම

විදේශ විනිමය පනත යටතේ විදේශ විනිමය වෙළෙඳාම් කිරීමට බලයලත් වෙළෙන්දන් (Authorized Dealers) ද පරිසීමිත වෙළෙන්දන් (Restricted Dealers) ද පත්කිරීමට මහ බැංකුවට බලය ලබා දී ඇත. විදේශ විනිමය පනත ක්‍රියාත්මක වීමට පටන් ගත් දිනයේ බැංකු කටයුතු පවත්වාගෙන යන ලද සියලු ම බලපත්‍රලාභී වාණිජ බැංකු ද සියලු ම බලපත්‍රලාභී විශේෂිත බැංකු ද විදේශ විනිමය වෙළෙඳාම් කිරීමට බලයලත් වෙළෙන්දන් ලෙස සලකනු ලැබේ. එ දිනට පසුව බැංකු පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලබන බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා බලයලත් වෙළෙන්දකු ලෙස ක්‍රියා කිරීම පිණිස මහ බැංකුවෙන් බලය දිය යුතු අතර, බලය ලබා දීමේ දී නිශ්චිත ව සඳහන් කරන කාර්යයන් සඳහා බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට ද බලයලත් වෙළෙන්දෙකු ලෙස ක්‍රියා කිරීම පිණිස මහ බැංකුව විසින් බලය ලබා දිය හැකි ය. එ මෙන් ම බැංකුව විසින් පනවනු ලබන නියමයන් සහ කොන්දේසිවලට යටත් ව ශ්‍රී ලංකාව ඇතුළත විදේශ විනිමය වෙළෙඳාම් කිරීම පිණිස අවසරලත් පරිසීමිත වෙළෙන්දන් ද මහ බැංකුව විසින් පත් කළ හැකි ය. මෙම පරිසීමිත වෙළෙන්දන් කාණ්ඩයට මුදල් මාරු කරන්නන් වැනි විදේශ විනිමය වෙළෙඳාම් කිරීමට අවසර ලබා ඇති තැනැත්තන් ඇතුළත් වේ. විනිමය පාලන පනත යටතේ බලයලත් වෙළෙන්දන් ලෙස පත් කරනු ලැබිය හැකි ව තිබුණේ බලපත්‍රලාභී වාණිජ බැංකු පමණක් වන අතර විදේශ විනිමය පනත යටතේ එය බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට ද බලපාන ලෙස පුළුල් කර ඇත. එය විදේශ විනිමය හා සම්බන්ධ ව සේවා සපයන්නන්ගේ තරගකාරිත්වය වැඩි කිරීමට හේතු වන සාධකයක් ලෙස හඳුනා ගත හැකි අතර එමගින් පාරිභෝගිකයාට වඩාත් ඉහළ ගුණාත්මක සේවාවක් ලබාගත හැකි වේ යැයි අපේක්ෂා කළ හැකි ය.

### 2. විදේශ විනිමය හා සම්බන්ධ ව ජංගම සහ ප්‍රාග්ධන ගනුදෙනු කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම

1994 වසරේ දී ශ්‍රී ලංකාව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ 8 වන ව්‍යවස්ථාවේ අඩංගු එකඟවීම්වලට අත්සන් තැබීමෙන් පසු ව ජංගම ගනුදෙනු සම්බන්ධයෙන් ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලදී. එ නම් ශ්‍රී ලංකාවේ යම් පුද්ගලයකුට ඔහුගේ ජංගම ගනුදෙනුවකට, උදාහරණයක් වශයෙන් ආනයනය, අපනයනය, විදේශීය ආයතනයකින් පවත්වන විභාගයක් සඳහා ගාස්තු ගෙවීම, විදේශීය සංචාරයක් කිරීමේ දී අදාළ වියදම් දැරීම, විදේශීය වෛද්‍ය ප්‍රතිකාර සඳහා ගෙවීම් යනාදිය සඳහා අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීමෙන් අනතුරු ව බලයලත් වෙළෙන්දෙකු හරහා පහසුවෙන් ම ගෙවීමේ හැකියාව ඇත.

ඇතැම් අවස්ථාවල දී බලයලත් වෙළෙඳුන් විසින් තම ගනුදෙනුකරුවන් වෙත නිසි තොරතුරු සැපයීමක් නො කරන විට ගනුදෙනුකරුවන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සිය ඉල්ලීම් සෘජු ව ඉදිරිපත් කරමින් සහන ඉල්ලන අවස්ථා ද ඇත. විවිධ ආයතන සහ පුද්ගලයන් වෙත තොරතුරු සහ ලේඛන ඉදිරිපත් කරමින් තම ගනුදෙනුව සම්පූර්ණ කිරීමට අවශ්‍ය උපදෙශ ලබාගැනීමට ගනුදෙනුකරුවන් උත්සාහ කිරීමේ දී ඔවුන්ගේ කාලයත් ශ්‍රමයත් ධනයත් ඒ සඳහා වැය වන අතර ඇතැම් අවස්ථාවල දී අදාළ ගනුදෙනුව සිදු කර ගැනීමට නො හැකි වන අවස්ථා ද ඇත.

මේ ආකාරයට ගනුදෙනුකරුවන් අපහසුතාවට ලක්වීම අවම කිරීම සඳහා විදේශ විදේශ විනිමය පනතේ 6 වැනි සහ 7 වැනි වගන්ති අනුව, පිළිවෙලින් ජංගම සහ ප්‍රාග්ධන ගනුදෙනු සඳහා ගෙවීමේ ක්‍රමවේද වඩාත් විධිමත් කර ඇත. යම් තැනැත්තෙකුට ජංගම හෝ ප්‍රාග්ධන ගනුදෙනුවක් සඳහා ගෙවීමක් කිරීමට අවශ්‍ය වූ විට ඒ සඳහා බලයලත් වෙළෙන්දෙකු හෝ පරිසීමිත වෙළෙන්දෙකු (එකී පරිසීමිත වෙළෙන්දා වෙත නිකුත් කර ඇති අවසර පත්‍රයේ නිශ්චිත ව සඳහන් විදේශ විනිමය ප්‍රමාණය දක්වා) හෝ වෙත තොරතුරු සහ ලේඛන ඉදිරිපත් කළ යුතු ය. බලයලත් වෙළෙන්දා හෝ පරිසීමිත වෙළෙන්දා ඒ ගනුදෙනුව සඳහා විදේශ විනිමය වෙළෙඳාම් කිරීමට ප්‍රථමයෙන් විදේශ විනිමය අවශ්‍ය වන්නේ ජංගම හෝ ප්‍රාග්ධන ගනුදෙනුවකට ද යන බවට, සහ ඒ ගනුදෙනු විධිමත් කරන්නා වූ වෙනත් යම් නීතියකට අනුකූල බවට සෑහීමට පත්විය හැකි වනු පිණිස තොරතුරු සපයන ලෙස හෝ ලේඛන ඉදිරිපත් කරන ලෙස හෝ සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි ප්‍රකාශ කරන ලෙස හෝ සිය ගනුදෙනුකරුගෙන් ඉල්ලා සිටිය යුතු වේ. එසේ සපයන්නා වූ තොරතුරු, ලේඛන හා ප්‍රකාශ මත එම ජංගම හෝ ප්‍රාග්ධන ගනුදෙනුව සඳහා විදේශ විනිමය වෙළෙඳාම් කිරීමට වෙළෙන්දාට හැකියාව ඇත. නමුත්, මෙසේ ඉල්ලීමක් කළ විට, එම ගනුදෙනුකරු තොරතුරු, ලේඛන හෝ ප්‍රකාශ හෝ සැපයීමට අපොහොසත් වූ අවස්ථාවක හෝ අවශ්‍යතාව ජංගම හෝ ප්‍රාග්ධන ගනුදෙනුවක් සඳහා නො වන බවට හෝ වෙනත් නීතියකට අනනුකූල බවට හෝ වෙළෙන්දා ට හැඟෙන විට එ වැනි ගනුදෙනුවක් සඳහා විදේශ විනිමය වෙළෙඳාම් කිරීම ප්‍රතික්ෂේප කළ යුතු වේ. මෙසේ ප්‍රතික්ෂේප කරන විට තමාගේ තීරණය සඳහා වූ හේතු තම ගනුදෙනුකරු වෙත ලිඛිත ව දැනුම් දීමට අදාළ වෙළෙන්දා බැඳී සිටින අතර එ කී හේතු දැනුම් දීම 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 9 වැනි වගන්තියේ ප්‍රතිපාදනවලට යටත් විය යුතු ය. එ නම් යම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් සැකයක් ඇති කර ගත් අවස්ථාවක දී හෝ මූල්‍ය බුද්ධි ඒකකයට වාර්තාවක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී හෝ ඒ සම්බන්ධයෙන් හෙළිදරව් කිරීමක් සිදු නො කළ යුතු ය.

වෙළෙන්දකු විසින් ගනු ලැබූ තීරණයෙන් යම් පුද්ගලයකු අගතියට පත් වන්නේ නම් එම පුද්ගලයාට අදාළ තීරණය දැනුම් දීමෙන් දින 14ක් ඇතුළත මහ බැංකුව වෙත අදාළ තීරණයට විරුද්ධ ව අභියාචනය කළ හැකි අතර ඒ තැනැත්තාට සහ වෙළෙන්දාට සවන් දීමට සාධාරණ අවස්ථාවක් ලබා දීමෙන් අනතුරු ව ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ තීරණය ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කළ හැකි ය.

මෙම අභියාචන ක්‍රියාවලිය විදේශ විනිමය පනත යටතේ හඳුන්වා දී ඇති නව ක්‍රමවේදයකි.

### 3. විදේශ විනිමය පනත යටතේ විවෘත කර පවත්වා ගෙන යා හැකි ගිණුම් වර්ග සරල කිරීම

විනිමය පාලන පනත යටතේ විවිධ ගිණුම් වර්ග හඳුන්වා දී තිබුණි. කෙ සේ වෙතත්, ගිණුම් වර්ග ප්‍රමාණය බහුල වීම නිසා කාලානුරූප ව ගිණුම් වර්ග ප්‍රමාණය අවම කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන තිබුණි. විදේශ විනිමය පනත යටතේ පහත ආකාරයට ගිණුම් විවෘත කර පවත්වා ගෙන යෑමේ හැකියාව ඇත.

1. පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම
   (Personal Foreign Currency Account)
2. ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම
   (Business Foreign Currency Account)
3. ආමුඛ ආයෝජන ගිණුම
   (Inward Investment Account)
4. ප්‍රතිමුඛ ආයෝජන ගිණුම
   (Outward Investment Account)
5. ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම
   (Capital Transactions Rupee Account)
6. රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම
   (Diplomatic Foreign Currency Account)
7. රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම
   (Diplomatic Rupee Account)

මීට පෙර විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ පවත්වාගෙන ගිය අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Non-Residence Foreign Currency - NRFC), නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Residence Foreign Currency - RFC), නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Resident Non National Foreign

Currency - RNNFC) සහ නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Non Resident Non National Foreign Account - NRNNFA) යන පෞද්ගලික ගිණුම් විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ලෙස පවත්වා ගෙන යා යුතු වන අතර විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් (Foreign Exchang Earners Account - FEEA), ආමුඛ ප්‍රේෂණ බෙදාහැරීමේ ගිණුම් (Inward Remittance Distribution Account - IRDA), නැව් සහ ගුවන් සේවා නියෝජිතයන් සඳහා වූ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Foreign Currency Accounts for Agents of Foreign Shipping Line/ Airline - FCAASA) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ලෙස පවත්වා ගෙන යා යුතු ය. උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාවේ සේවය කරන විදේශීය ජාතිකයෙකු විසින් පවත්වාගෙන යන ලද නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් විදේශ විනිමය පනත යටතේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් ලෙස පවත්වා ගෙන යා හැකි ය. ඔහුගේ සේව්‍යයාගේ රුපියල් ගිණුමෙන් ඔහුට ලැබෙන වැටුප, විදේශීය මුදල්වලට හරවා ඔහුගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමේ තැන්පත් කර ගත හැකි ය.

එසේ ම මීට පෙර විදේශ ව්‍යවහාර මුදල්වලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් විවෘත කරන ලද හා පවත්වා ගෙන යන සියලු සුරැකුම්පත් ආයෝජන ගිණුම් (Securities Investment Account - SIA) සහ විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම් (Special Foreign Currency Invesment Deposit Account - SFIDA) අභ්‍යන්තර ආයෝජන ගිණුම් ලෙසත් දැනට පවතින සියලු ම අනේවාසික රුපියල් ගිණුම් (Non Resident Rupee Account - NRRA), අනේවාසික අවහිර කළ ගිණුම් (Non Resident Blocked Account - NRBA) සහ සංක්‍රමික අවහිර කළ ගිණුම් (Migrant Blocked Account - MBA), ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් ලෙසත් පවත්වා ගෙන යා යුතු ය.

පෞද්ගලික විදේශ ව්‍යවහාර ගිණුම් සහ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා ගිණුම් හිමියාගේ ජංගම සහ ප්‍රාග්ධන ගනුදෙනු සම්බන්ධයෙන් ප්‍රතිමුඛ ප්‍රේෂණ කිරීමේ අවසරය පවතින අතර ගිණුම් හිමියාගේ ජංගම හෝ ප්‍රාග්ධන ගනුදෙනුවකට අදාළ ගෙවීම් පියවීම් හැකියාව පහසුවෙන් ම මේ හරහා ලබාගත හැකි ය. ගිණුම් හිමියාගේ ආමුඛ ප්‍රේෂණයන් ද මෙ කී ගිණුම්වලට පහසුවෙන් ම ගෙන්වා ගත හැකි ය.

ශ්‍රී ලංකාවේ නේවාසිකයන් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා ප්‍රතිමුඛ ආයෝජන ගිණුම උපයෝගී කරගත හැකි ය. අනේවාසික තැනැත්තන් විසින් ශ්‍රී ලංකාවේ සිදුකරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා ආමුඛ ආයෝජන ගිණුම උපකාරී වේ.

### 4. ශ්‍රී ලංකාවේ නේවාසිකයන් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා ලබා දී තිබෙන අවසර පුළුල් කිරීම

විනිමය පාලන පනතේ ප්‍රතිපාදන යටතේ 2011 වසරේ සිට ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන්ට යම් කොන්දේසි සහ නියමවලට යටත් ව ශ්‍රී ලංකාවෙන් පිටත ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමට අවසර ලබා දී තිබූ අතර විදේශ විනිමය පනත යටතේ එසේ ලබා දී තිබූ අවසරයන් වඩාත් පුළුල් කර ඇත. සුදුසුකම් ලත් නේවාසික ආයෝජකයකු ප්‍රතිමුඛ ආයෝජන ගිණුම හරහා ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද සමාගමක කොටස් හෝ ණය සුරැකුම්, නියාමනය කරන ලද ඒකකභාර, අන්‍යෝන්‍ය අරමුදල්වල ඒකක හෝ ආයෝජනය සිදු කරන අවස්ථාවේ දී අවම වශයෙන් ශ්‍රී ලංකාවේ පවතින ස්වෛරීය ශ්‍රේණිගත කිරීම් ඇති ශ්‍රේණියක ශ්‍රේණිගත කර ඇති විදේශීය රජයකින් නිකුත් කරන ලද්දා වූ ස්වෛරීත්ව බැඳුම්කර මිලට ගත හැකි ය. මීට පෙර එසේ අවසර ලබා දී තිබුණේ සමාගම් කොටස් සහ ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජනය කිරීමට පමණි. එ මෙන් ම ආයෝජකයකු විසින් ආයෝජනය කිරීමට අවසර ලත් සීමාව ද ඉහළ නංවා ඇත. උදාහරණයක් වශයෙන් කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත සමාගමක් විසින් විදේශීය සමාගමකින් නිකුත් කරන කොටස් මිල දී ගැනීමක් කරන අවස්ථාවක දී මීට පෙර ලිත් වර්ෂයක් සඳහා එක්සත් ජනපද ඩොලර් 500,000 ලෙස පැවති සීමාව එක්සත් ජනපද ඩොලර් මිලියන 2 දක්වා ඉහළ නංවා ඇත. ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී කොටස් වෙළෙඳපොළක ලැයිස්තුගත නො කළ සමාගමක් විසින් ලිත් වර්ෂයක් සඳහා එක්සත් ජනපද ඩොලර් 500,000 දක්වා ද ශ්‍රී ලංකාවේ ලියාපදිංචි හවුල් ව්‍යාපාරයක් විසින් සිය හවුල් ව්‍යාපාර පවතින සම්පූර්ණ කාලය ඇතුළත දී එක්සත් ජනපද ඩොලර් 300,000 දක්වා ද තනි පුද්ගලයකු විසින් ජීවිත කාලයට ම එක්සත් ජනපද ඩොලර් 200,000 දක්වා ද ආයෝජනය කළ හැකි ය.

මෙහි දී ප්‍රතිමුඛ ආයෝජන ගිණුම හරහා සිදු කරනු ලබන්නා වූ ආයෝජනවල ආදායම්, සහ ආයෝජන විකිණීමේ දී හෝ යම් බැහැර කිරීමට ලක් කරන්නා වූ අවස්ථාවක දී ඒ සඳහා ලැබෙන්නා වූ ගෙවීම්, නැවත ශ්‍රී ලංකාවට අදාළ ප්‍රතිමුඛ ආයෝජන ගිණුම හරහා ම ගෙන ඒම සිදු කළ යුතු ය.

සේවක කොටස් හිමිකම් සැලැස්මක් යටතේ හෝ සේවක කොටස් වරණීය ක්‍රමයක් යටතේ ශ්‍රී ලාංකික සමාගමක සේවකයන්ට අදාළ සමාගමේ විදේශීය මව් සමාගම පිරිනමනු ලබන කොටස් සඳහා ඉහත සඳහන් කරන ලද සීමාව අදාළ නො වේ. එ සේ ම, යම් සුදුසුකම් ලත් ආයෝජකයෙකුට මුදල් ගෙවීමකින් තොර ව අවසරලත් විදේශීය ආයෝජනයක් හිමි වේ නම් එම ආයෝජනය දැරීමට විනිමය පාලන පනත යටතේ මීට පෙර විශේෂයෙන්

අවසර ගැනීමක් කළ යුතු ව තිබූ නමුත් විදේශ විනිමය පනත යටතේ නිකුත් කර ඇති නියමය අනුව, එ වැනි මුදල් ගෙවීමකින් තොර ව ලැබෙන විදේශීය ආයෝජන දැරීමට එ මගින් ම අවසරය ලබා දී ඇත.

මෙහි දී වඩාත් විචක්ෂණශීලී ව ශ්‍රී ලංකාවට වාසිදායක ආකාරයට විදේශීය ආයෝජන සිදු කරන ආයෝජකයන් දිරි ගැන්වීමට සහ ආයෝජන වඩ වඩාත් සාර්ථක ව සිදු කර ගැනීමට උත්තේජනයක් ලබා දීමට, ප්‍රතිමුඛ ආයෝජන ගිණුම තුළට බැර කරන ලද පූර්ව ආයෝජනයන්හි ප්‍රාග්ධන ආදායම්වලින් සියයට පනහක මුදලක් මීට පෙර සඳහන් කරන ලද සීමාවන්වලට ඔබ්බෙන් නැවතත් ආයෝජනය කිරීමට අවසර ලබා දී ඇත.

## 5. අනේවාසික පුද්ගලයකු විසින් ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා ලබා දී තිබෙන අවසර පුළුල් කිරීම

ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික යම් තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාව තුළ සිදු කළ හැකි ප්‍රාග්ධන ආයෝජනයන් ද විදේශ විනිමය පනත යටතේ පුළුල් කර ඇත. මේ යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගම්වල කොටස්, කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරනු නො ලැබූ සමාගමක කොටස්, ණය සුරැකුම්පත්, ශ්‍රී ලංකාවේ ස්ථාපනය කරනු ලැබූ සමාගම් වෙත විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ණය ප්‍රදානය, ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකු, මුදල් සමාගම්, සහ කල්බදු සමාගම් විසින් නිකුත් කරනු ලබන ණය සුරැකුම්පත් හෝ ඒ සඳහා ණය ප්‍රදානය, ඒකකභාර හෝ අන්‍යොන්‍ය අරමුදල්වල ඒකකයන්හි ආයෝජනය, රජයේ සුරැකුම්පත්, ශ්‍රී ලංකා මහ බැංකුව හෝ වෙනත් යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් විසින් නිකුත් කරනු ලැබූ සුරැකුම්පත්, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර, බලපත්‍රලාභී මූල්‍ය ආයතනයන්හි තැන්පතු, නිශ්චල දේපළ යනාදියෙහි ආයෝජනය කිරීමට අනේවාසික ආයෝජකයන්ට ඉඩ සලස්වා ඇත. වසර 2017 නොවැම්බර් මස 17 දින නිකුත් කරන ලද අංක 2045/56 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ දෙවන උපලේඛනයේ අඩංගු නියම, කොන්දේසි, බැහැර කිරීම් සහ සීමා කිරීම්වලට යටත් ව මෙකී ආයෝජන සිදු කළ යුතු වේ.

මෙම ප්‍රාග්ධන ආයෝජන සඳහා අවශ්‍ය වන සියලු අරමුදල් බලය ලත් වෙළෙන්දෙකු වශයෙන් ක්‍රියාකරන බලපත්‍රලාභී වාණිජ බැංකුවක පවත්වා ගෙන යන්නා වූ ආමුඛ ආයෝජන ගිණුමක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කළ යුතු ය. එ ලෙස ආමුඛ ආයෝජන ගිණුමක් හරහා ප්‍රේෂණය කරන ලද්දා වූ මුදල්වලින් සිදු කරනු ලබන ආයෝජනයන්හි ආයෝජන ආදායම් සහ ප්‍රාග්ධන ලැබීම් එකී ආමුඛ ආයෝජන ගිණුමට ම බැර කළ හැකි අතර වෙනත් කිසිදු අවසර ඉල්ලා සිටීමකින් තොර ව ලංකාවෙන් පිටත ආයෝජකයා විසින් පවත්වා ගෙන යනු ලබන ගිණුමකට අදාළ ආදායම් සහ ප්‍රාග්ධන ලැබීම් ප්‍රේෂණය කළ හැකි ය. ඉහත සඳහන් කරන ලද ගැසට් පත්‍රයේ ප්‍රතිපාදන අනුව ආයෝජනය කරන්නා වූ යම් ආයෝජකයෙකු සිය ආයෝජන ආදායම් ලැබීමේ දී නැවත නැවතත් ප්‍රති ආයෝජනය සඳහා එ කී මුදල් භාවිත කළ හැකි අතර තමාට කැමති අවස්ථාවක ශ්‍රී ලංකාවෙන් බැහැරට අදාළ මුදල් රැගෙන යා හැකි වේ.

## 6. සංක්‍රමණික දීමනා ඉහළ නැංවීම

වෙනත් විදේශ රටක ස්ථිර පදිංචියට වීසා බලපත්‍රයක් ලබා ගත් හෝ වෙනත් රටක පුරවැසිභාවයක් (ද්විත්ව පුරවැසිභාවය ද සැලකේ) ලබා ගත් හෝ වයස අවුරුදු 18ට වැඩි ශ්‍රී ලාංකිකයෙකු එ කී විදේශ රටේ පදිංචියට යන විට ඔහුට සංක්‍රමණික දීමනාවක් (Migration Allowance) ලබාගත හැකි ය.

මීට පෙර එක්සත් ජනපද ඩොලර් 150,000ක් ලෙස පැවැති කේවල සංක්‍රමණික ප්‍රාග්ධන දීමනාව, විදේශ විනිමය පනත යටතේ එක්සත් ජනපද ඩොලර් 200,000 තෙක් ඉහළ නංවා ඇත. මීට පෙර එක්සත් ජනපද ඩොලර් 20,000ක් ලෙස පැවැති වාර්ෂික සංක්‍රමණික දීමනාව එක්සත් ජනපද ඩොලර් 30,000 දක්වා ඉහළ නංවා ඇත.

විගාමිකයාගේ සියලු ම චංචල සහ නිශ්චල දේපළ වත්කම් විකිණීමෙන් ලබන්නා වූ මුදල්, විවාහක ස්වාමිපුරුෂයාගෙන් හෝ භාර්යාවගෙන් හෝ තම දෙමව්පියන්ගෙන් ලැබෙන්නා වූ ත්‍යාග, වර්තමාන ආදායම් සහ විශ්‍රාමික පාරිතෝෂික දීමනා, බලපත්‍රලාභී බැංකුවක පවත්වා ගෙන යනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක තැන්පත් කළ යුතු වන අතර යම් සංක්‍රමණිකයෙකු ගේ වර්තමාන ආදායම (එ නම් පොලී, ලාභාංශ, විශ්‍රාම වැටුප්, කුලී බදු) සහ විශ්‍රාමික පාරිතෝෂික දීමනා (එ නම් සේවා නියුක්තකයන්ගේ අර්ථසාධක අරමුදල (Employment Provident Fund - EPF), සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල (Employees Trust Fund - ETF), පාරිතෝෂික, විශ්‍රාම වැටුප් හෝ වෙනත් විශ්‍රාම අරමුදලකින් ලැබෙන්නා වූ මුදල්), එකී සංක්‍රමණික දීමනා සඳහා පනවා ඇති ප්‍රේෂණ සීමාවලින් නිදහස් වේ.

සංක්‍රමණික දීමනාව අදාළ විගාමිකයාගේ ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වා ගෙන යනු ලබන ගිණුමකට ප්‍රේෂණය කළ හැකි අතර ඊට අමතර ව විගාමිකයාගේ කැමැත්ත අනුව ඔහු විසින් ශ්‍රී ලංකාවේ ම පවත්වා ගෙන යනු ලබන පුද්ගලික විදේශ ව්‍යවහාර ගිණුමකට බැර කළ හැකි ය. එසේත් නැත්නම් ශ්‍රී ලංකාවේ ආයෝජන සිදු කිරීම සඳහා ඔහුගේ ආමුඛ ආයෝජන ගිණුමට බැර කළ හැකි ය. පෞද්ගලික විදේශ ව්‍යවහාර ගිණුමක හෝ ආමුඛ ආයෝජන ගිනුමක

ඇති මුදල් ඕනෑ ම අවස්ථාවක ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රේෂණය කිරීමේ හැකියාව පවතී.

### 7. ශ්‍රී ලංකාවෙන් බැහැර බැංකුවක ගිණුමක් ආරම්භ කිරීමට, පවත්වා ගෙන යෑමට ක්‍රියාත්මක කිරීමට අවසර ලබා දීම

ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන ගිණුම සම්පූර්ණයෙන් ම ලිහිල් කොට නොමැති නිසා නේවාසිකයන්ට ශ්‍රී ලංකාවෙන් බැහැර බැංකුවක ගිණුමක් විවෘත කිරීමට විදේශ විනිමය පනත යටතේ අවසර අවශ්‍ය වේ.

ශ්‍රී ලංකාවෙන් බැහැර බැංකුවක ගිණුමක් ආරම්භ කිරීමට, පවත්වා ගෙන යෑමට, ක්‍රියාත්මක කිරීමට පහත සඳහන් තැනැත්තන්ට අවසර ලබා දී ඇත. මෙම අවසරය, මීට පෙර විනිමය පාලන පනත යටතේ ලබා දී තිබූ අවසරයන්ට බොහෝ සෙයින් සමාන වේ.

ව්‍යාපාර කටයුතු සඳහා හෝ අධ්‍යාපනය සඳහා හෝ වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා හෝ විදේශගත වූ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු, ශ්‍රී ලංකාවෙන් බැහැර වෘත්තීමය හෝ වෘත්තීය සේවා සපයනු ලබන පුද්ගලයකු, ශ්‍රී ලංකාවෙන් පිටත ආයෝජනය කරනු ලබන ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගම හෝ ආයතනයක්, වෙළෙඳ භාණ්ඩ අපනයනකරුවන් වෙනත් රටක වලංගු ස්ථිර පදිංචිය සඳහා වීසා අවසර පත්‍රයක් ඇති තැනැත්තකු, ද්විත්ව පුරවැසියකු, ශ්‍රී ලංකාවෙන් පිටතට විදේශ අධ්‍යාපනය ලැබීමට අදහස් කරන සහ ඒ සඳහා වීසා බලපත් ලබා ගැනීමේ දී කොන්දේසියක් ලෙස අදාළ රටේ බැංකුවක ගිණුමක් ආරම්භ කළ යුතු යැයි එම රටේ අධිකාරිය විසින් නියම කරනු ලැබූ තැනැත්තකුට ශ්‍රී ලංකාවෙන් බැහැර බැංකුවක ගිණුමක් ආරම්භ කිරීමට, පවත්වාගෙන යෑමට, සහ ක්‍රියාත්මක කිරීමට, අවසර ලබා දී ඇත.

### 8. "නේවාසික පුද්ගලයකු" යන්නෙහි නිර්වචනය වඩාත් පැහැදිලි කිරීම

විදේශ විනිමය පනතේ සහ ඒ යටතේ ඉදිරිපත් කරන ලද නිකුත් කරන ලද නියමයන්හි "නේවාසික පුද්ගලයකු" යන්න බහුල ව භාවිත කරන වචනයක් ලෙස පෙනී යයි. එකී පනතේ 31 වන වගන්තිය ප්‍රකාර ව අදාළ අමාත්‍යතුමන් විසින් "නේවාසික පුද්ගලයකු" (A person resident in Sri Lanka) යන්න නිශ්චය කරමින් 2017 නොවැම්බර් මස 17 දින නිකුත් කරන ලද අංක 2045/56 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ නියමයක් නිකුත් කර ඇත. එහි සඳහන් පරිදි යම් පුද්ගලයකු නේවාසික පුද්ගලයකු දැයි යන්න තීරණය කරන දිනට පෙර මාස 12ක කාලය ඇතුළත දී ශ්‍රී ලංකාව තුළ කඩින් කඩ හෝ සමස්තයක් වශයෙන් ගත් කල දින 183ක් රැඳී සිටි යම් තැනැත්තෙකු නේවාසික පුද්ගලයකු ලෙස සැලකිය හැකි ය. මීට පෙර නේවාසික පුද්ගලයකු දැ යි තීරණය කරන විට එකී පුද්ගලයා ශ්‍රී ලංකාවේ ස්ථිර පදිංචි පුද්ගලයකු දැ යි තීරණය කළ යුතු ව තිබූ අතර "ස්ථිර" යන වචනයට විවිධ පුද්ගලයන් විසින් විවිධ අර්ථකථන ලබා දීම හේතුවෙන් ගැටලුකාරී අවස්ථා පැන නැගිණි. විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද නියමයෙහි අඩංගු දින 183 කාලය නිශ්චිත ව ගණන් බැලිය හැකි බැවින් එ ලෙස විවිධ අර්ථකථන ලබා දිය නො හැකි වේ.

යම් පුද්ගලයකු නේවාසික පුද්ගලයකු දැ යි යන්න තීරණය කරන දිනට පෙර මාස 12ක කාලය ඇතුළත දී සමස්තය දින 182කට නො වැඩි වූ කාල සීමාවක් තාවකාලික ව ශ්‍රී ලංකාවෙන් බැහැර ව සිටි ශ්‍රී ලාංකික පුරවැසියකු, ශිෂ්‍ය වීසා මත විදේශ අධ්‍යාපනය ලබන ශ්‍රී ලාංකික පුරවැසියකු, ශ්‍රී ලංකා රජයේ රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්, රාජ්‍ය තාන්ත්‍රික නිලධාරියෙකුගේ කාර්ය මණ්ඩල සාමාජිකයෙකු හෝ පවුලේ සාමාජිකයෙකු, ශ්‍රී ලංකාවෙන් බැහැර දී බඳවා ගනු ලැබූ තැනැත්තන් හැර ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරනු ලැබූ රාජ්‍ය සංස්ථාවක, රාජ්‍ය ආයතනයක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, බලපත්‍රලාභී බැංකුවක හෝ සමාගමක කාර්ය මණ්ඩල සාමාජිකයෙකු විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද නියමය අනුව නේවාසිකයෙකු ලෙස සැලකිය හැකි ය.

එ සේ ම ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සමාගම්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ විදේශ සමාගම්, සහ අක්වෙරළ සමාගම් ද රාජ්‍ය නො වන සංවිධාන ඇතුළු ව ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කරනු ලැබූ සමාජ සංගම් හෝ වෙනත් සංවිධාන ද නේවාසික ලෙස සැලකේ. මීට අමතර ව වෙළෙඳ නැව් පනතේ අර්ථයට අනුකූල ව ශ්‍රී ලංකාවේ නැවක සේවය කළ කාල සීමාව තුළ දී ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන නැවියකු ද නේවාසිකයෙකු ලෙස සැලකේ.

එ මෙන් ම ශ්‍රී ලංකාවේ නේවාසික වීසා බලපත්‍ර දරන හෝ ආගමන සහ විගමන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද වීසා බලපත්‍රයක් අනුව ශ්‍රී ලංකාවේ සේවය කරන විජාතික පුද්ගලයන් ද නේවාසික ලෙස සැලකිය හැකි ය.

### 10. වැඩිදුර විස්තර ලබා ගැනීම

විදේශ විනිමය පනත ඉතා පුළුල් මාතෘකා රාශියක් ඔස්සේ විහිදෙන බැවින් එහි අඩංගු සියලු ම කරුණු මෙම ලිපිය මගින් සාකච්ඡාවට භාජනය කිරීම අපහසු බව ඔබට වැටහෙනු ඇති. විදේශ විනිමය පනත සහ ඒ පනත යටතේ නිකුත් කරන ලද නියමයන් ඇතුළු ව වෙනත් විස්තර ඔබට දැන ගැනීමට අවශ්‍ය නම් ඒ සඳහා කරුණාකර www.dfe.lk වෙබ් අඩවියට පිවිසෙන්න.■

# ආර්ථික සංවර්ධනය සඳහා ඉවහල් වන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය

**විනීතා හේරත්**
**ප්‍රාදේශීය කළමනාකාරිනී,**
**මාතලේ ප්‍රාදේශීය කාර්යාලය**

ලොව ආර්ථික සංවර්ධනය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සුවිසල් කාර්යභාරයක් ඉටු කරයි. විශේෂයෙන් ම සංවර්ධනය වෙමින් පවත්නා රටවල ආදායම් බෙදී යෑමේ විෂමතාව අඩු කොට ඇති නැති පරතරය යම්තාක් දුරට පියවීමට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ඉවහල් වෙයි. එ මෙන් ම සංවර්ධනයේ භූගෝලීය වශයෙන් පවත්නා විෂමතා අඩු කොට තුලිත ආර්ථික වර්ධනයක් ඇතිකිරීමට මං පාදයි. දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයටත් ශ්‍රම වෙළෙඳපොළේ රැකියා අවස්ථා ජනනය තුළින් විරැකියාව පහළ හෙළීමටත් ඉවහල් වෙයි. දේශීය සම්පත් උපයෝජනයට සහ කාලයත් සමඟ ව්‍යවසාය වැඩි දියුණු වී පුළුල්වීමෙන් දේශීය වෙළෙඳපොළ ඉක්මවා විදේශ වෙළෙඳපොළ වෙත ප්‍රවේශ වීමෙන් විදේශ විනිමය ඉපයීමටත් උපකාරි වෙයි. අනෙක් අතට ආනයන සඳහා ආදේශන නිපදවීම තුළින් ආර්ථිකයේ විදේශ විනිමය ඉතිරිකර ගැනීමට අවකාශ සලසයි.

මේ නිසා ආර්ථික සංවර්ධනය සඳහා නොයෙකුත් ආකාරයෙන් දායක වන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය දිරිගැන්වීමට එක් එක් රටවල් විවිධ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

කෙසේ වෙතත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වෙන් කොට හඳුනාගැනීමෙහිලා ලොව පිළිගත් නිශ්චිත නිර්වචනයක් දක්නට නො ලැබේ. මේ සඳහා එක් එක් රටවල් හා ආයතන ඒවායේ අරමුණු අනුව විවිධ නිර්ණායක භාවිත කරයි. එ මෙන් ම ආර්ථිකයේ සිදුවන වෙනස්කම්වලට ගැලපෙන ලෙස ඇතැම් අවස්ථාවල නිර්ණායකවල කාලීන වෙනස්කම් සිදුකරයි. විශේෂයෙන් ම වත්කම්වල වටිනාකම, පිරිවැටුම වැනි මූල්‍යමය නිර්වචන බොහෝ විට වෙනස් වේ. හේතුව මිල මට්ටමේ ඉහළ යෑමත් සමඟ මූර්ත වටිනාකම්වල සිදුවන ක්ෂයවීම යි.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වෙන්කොට හඳුනාගැනීමේ නිර්ණායක, ආර්ථික සංවර්ධනයෙහිලා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල වැදගත්කම හා ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රයේ පවත්නා ගැටලු පිළිබඳව මෙම ලිපිය මගින් සැකෙවින් විමසා බැලීමට අපේක්ෂිත ය.

## ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය හඳුනාගැනීමේ නිර්ණායක

පරිමාව අනුව ව්‍යවසාය වෙන් කොට හඳුනාගැනීමේ දී බොහෝ රටවල් ව්‍යවසායවල සේවා නියුක්තිය, එහි වත්කම් හෝ ප්‍රාග්ධනයෙහි ප්‍රමාණය, ආදායම (විකුණුම් හෝ පිරිවැටුම) වැනි කරුණු පදනම් කරගනී. සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල් රැසක් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය හඳුනාගැනීමෙහිලා ආර්ථිකයේ එක් එක් අංශ වෙන් වෙන් ව විමසා බලා වර්ගීකරණය කරයි. ආසියානු ආර්ථික කිහිපයක ව්‍යවසාය වර්ගීකරණයේ දී ආර්ථිකයේ එක් එක් අංශ සඳහා වත්කම් හෝ ආදායම් නිර්ණායකය යොදා ගෙන ඇති ආකාරය 01 වැනි වගුවෙහි දැක්වේ. ඒ අනුව මැලේසියාවේ නිෂ්පාදන කර්මාන්ත සම්බන්ධයෙන් ගත්විට යම් ව්‍යවසායක ආදායම රිංගිට් (RM) මිලියන 50ට අඩු නම් (ඩොලර් මිලියන 12 ක් පමණ) එම ව්‍යවසාය සුළු හා මධ්‍ය පරිමාණ ලෙස සලකයි. සේවා සහ අනෙකුත් අංශ සම්බන්ධ ව ගත්විට එරට සුළු හා මධ්‍ය පරිමාණ ගණයට ගැනෙන ව්‍යවසායවල ආදායම රිංගිට් මිලියන 20ට අඩු ය. ජපානය එහි ආර්ථිකය නිෂ්පාදන, තොග වෙළෙඳාම, සේවා සහ සිල්ලර වෙළෙඳාම ලෙස අංශ 4ට බෙදා ඒ ඒ අංශ සඳහා නිර්ණායක ඉදිරිපත් කරයි. ඒ අනුව නිෂ්පාදන අංශයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය යටතට ගැනෙන්නේ වත්කම්/ප්‍රාග්ධනය යෙන් මිලියන 300 හෝ ඊට අඩු ව්‍යවසායන් ය. තොග වෙළෙඳ අංශයේ ව්‍යවසායවලින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය යටතට ගැනෙන්නේ වත්කම්/ප්‍රාග්ධනය යෙන් මිලියන 100 හෝ ඊට අඩු ව්‍යවසායන් ය. සිල්ලර වෙළෙඳ සහ සේවා අංශ සම්බන්ධයෙන් මෙම නිර්ණායකය වත්කම්/ප්‍රාග්ධනය යෙන් මිලියන 50 හෝ ඊට වඩා අඩු ද වේ. චීනයෙහි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වර්ගීකරණයේ දී ආර්ථිකයේ අංශ සඳහා නිර්වචන 15ක් පදනම් කරගනී. සිංගප්පූරුව සහ ඉන්දුනීසියාව ගත්විට එක් එක් අංශ සඳහා වෙන්වූ නිර්වචන නොමැති අතර සියලු ම අංශ සඳහා එකම නිර්වචනයක්

පදනම් කරගනී. ඒ අනුව සිංගප්පූරුවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය යටතට ගැනෙන්නේ වාර්ෂික ආදායම සිංගප්පූරු ඩොලර් මිලියන 100ට අඩු ව්‍යවසායන් ය. ඉන්දුනීසියාවේ වත්කම් වටිනාකම ඉන්දුනීසියානු රුපියල් මිලියන 10,000ට අඩු සහ වාර්ෂික ආදායම ඉන්දුනීසියානු රුපියල් මිලියන 50,000ට අඩු ව්‍යවසාය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ලෙස සලකයි. කසකස්තානය සහ පිලිපීනය ද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය නිර්වචනයේ දී ආර්ථිකයේ සියලු ම අංශ සඳහා එකම නිර්වචනයක් යොදාගනී. එක් රටක් තුළ ම වුව ද විවිධ ආයතන, විවිධ අමාත්‍යාංශ එකිනෙකට වෙනස් නිර්වචන ඉදිරිපත් කරයි. මෙම තත්ත්වය ජාතික ප්‍රතිපත්ති සම්පාදනයේ දී ගැටලුවක් වේ. එ මෙන් ම තුලනාත්මක සංසන්දනයක දී ද එය බාධාවකි. මේ නිසා ඇතැම් රටවල් මේ වන විටත් මේ සඳහා පොදුවේ පිළිගත හැකි නිර්ණායක ගොඩනැංවීමට උත්සාහ කරනු දක්නට ලැබේ. උදාහරණ වශයෙන් යුරෝපීය සංගමය තම සාමාජික රටවල් සඳහා

**01 වැනි වගුව**

**ආර්ථිකයේ අංශ අනුව වත්කම් හෝ ආදායම් පදනම් කර ගනිමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වර්ගීකරණය**

| රට/රටවල් කාණ්ඩය | අංශය | වත්කම් | ආදායම් | වත්කම් | ආදායම් |
|---|---|---|---|---|---|
| | | දේශීය ව්‍යවහාර මුදල් ඒකක මිලියන | දේශීය ව්‍යවහාර මුදල් ඒකක මිලියන | ඩොලර් මිලියන | ඩොලර් මිලියන |
| ජපානය | නිෂ්පාදන | 300 | | 28 | |
| | තොග වෙළෙඳාම | 100 | | 0.9 | |
| | සිල්ලර වෙළෙඳාම | 50 | | 0.5 | |
| | සේවා | 50 | | 0.5 | |
| කොරියානු ජනරජය | නිෂ්පාදන | 8000 | | 6.9 | |
| | ප්‍රාථමික / ඇතැම් සේවා | | 20,000 | | 17.2 |
| සිංගප්පූරුව | සියලු ම | | 100 | | 73 |
| චීනය | බැර කර්මාන්ත | | 400 | | 61.3 |
| | තොග වෙළෙඳාම | | 400 | | 61.3 |
| තායිලන්තය | පොදු | 200 | | 5.7 | |
| | තොග වෙළෙඳාම | 100 | | 2.8 | |
| | සිල්ලර වෙළෙඳාම | 60 | | 1.7 | |
| මැලේසියාව | නිෂ්පාදන | | 50 | | 12.4 |
| | සේවා සහ වෙනත් | | 20 | | 5 |
| කසකස්ථානය | සියලු ම | | 5200 | | 15.6 |
| පිලිපීනය | සියලු ම | 100 | | 2.1 | |
| ඉන්දුනීසියාව | සියලු ම | 10,000 | 50,000 | 0.7 | 3.6 |
| ඉන්දියාව | නිෂ්පාදන | 300 | | 4.5 | |
| | සේවා | 150 | | 2.3 | |
| වියට්නාමය | පොදු | 100,000 | | | 4.5 |
| | වෙළෙඳ සහ සේවා | 50,000 | | | 2.2 |
| බංගලාදේශය | නිෂ්පාදන | 300 | | 3.8 | |
| | සේවා | 150 | | 1.9 | |
| කාම්බෝජය | සියලු ම | | | 0.5 | |

මූලාශ්‍රය - ආසියානු සංවර්ධන බැංකුව

ඉදිරිපත් කර ඇති නිර්දේශය අනුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය යටතට ගැනෙන්නේ සේවකයින් සංඛ්‍යාව 250ට අඩු සහ පිරිවැටුම යුරෝ මිලියන 50ට අඩු ව්‍යවසායන් ය. එහෙත් එම සාමාජික රටවල් වුව ද තම දේශීය කටයුතුවල අවශ්‍යතාව සඳහා තම රටවල ම නිර්ණායක යොදාගනී.

කෙසේ වෙතත් මෙයට පෙර ද සඳහන් කරන ලද පරිදි බොහෝ රටවල් ආර්ථිකයේ සිදුවන වෙනස්කම්වලට ගැලපෙන ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය පිළිබඳ නිර්ණායක කාලීන ව වෙනස් කරයි.

## ව්‍යවසාය නිර්වචනයේ කාලීන වෙනස්කම්

මහජන චීනයෙහි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය නිර්වචනය 2003 හා 2011 වසරවල වෙනස් කර ඇත. 2011 හඳුන්වා දෙන ලද නිර්ණායකය අනුව ආර්ථිකය අංශ 15කට බෙදා ඒ ඒ එක් එක් අංශ සඳහා වෙන් වෙන් නිර්ණායක හඳුන්වා දී ඇත. ඇතැම් අංශ සඳහා සේවා නියුක්තිය හා කාරක අයභාරය (Operating Revenue) ද ඇතැම් අංශ සඳහා සේවා නියුක්තිය, වත්කම් හෝ අයභාරය ද පදනම් කරගනිමින් නිර්වචනය කර ඇත. සේවකයන් 1000ට අඩු හෝ ආදායම චීන යුආන් (CNY) මිලියන 400ට අඩු (ඩොලර් මිලියන 61ක පමණ) බැර කර්මාන්ත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ලෙස නිර්වචනය කර ඇත. 2011 දී හඳුන්වා දී ඇති නිර්ණායකවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් නම් 2003 නිර්ණායක ලෙස ගත් සේවා නියුක්ති සංඛ්‍යාවට වඩා අඩු සේවක සංඛ්‍යාවක් පදනම්කරගෙන තිබීමයි. නිදසුනක් ලෙස ගත්විට 2003 වසරේ ප්‍රවාහන අංශයෙහි සේවා නියුක්තිය 3000ක් හෝ ඊට වඩා අඩු ව්‍යවසාය සුළු හා මධ්‍ය පරිමාණ යටතට ගණන් ගන්නා ලද අතර 2011 දී සේවක සංඛ්‍යාව 1000 හෝ ඊට අඩු ව්‍යවසාය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ලෙස හඳුනාගෙන ඇත. කෙසේ වෙතත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වෙන්කොට හඳුනාගැනීමේ ආදායම් නිර්ණායකයේ ඉහළ යෑමක් දක්නට ලැබේ. උදාහරණ වශයෙන් තොග වෙළෙඳ අංශයේ ආදායම යුආන් මිලියන 300 හෝ ඊට අඩු ව්‍යවසාය සුළු පරිමාණ ව්‍යවසාය ලෙස 2003 වසරේ හඳුනාගෙන තිබුණ ද 2011 වසරේ නිර්ණායක අනුව එය යුආන් මිලියන 400 දක්වා ඉහළ ගොස් ඇත.

2011 වසරේ සිංගප්පූරුව ද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සම්බන්ධ සිය නිර්වචනය වෙනස්කර ඇත. එතෙක් නිෂ්පාදන අංශය සම්බන්ධ නිර්වචනය වත්කම් මත පදනම් වූ අතර නිෂ්පාදන නොවන අංශය සම්බන්ධ නිර්වචනය සේවා නියුක්තිය මත පදනම් විය. එහෙත් 2011 දී අංශ සඳහා වෙනස්ව පැවති නිර්වචන වෙනුවට එක් නිර්වචනයක් බිහි විය. ඒ අනුව සියලු ම අංශ සඳහා සේවා නියුක්තිය 200 වැඩි නොවන සහ විකුණුම් ආදායම සිංගප්පූරු ඩොලර් 100 නො ඉක්මන ව්‍යවසාය සුළු හා මධ්‍ය පරිමාණ යටතට ගැනිණි. සිංගප්පූරු රජය ව්‍යවසාය නිර්වචනයේ වත්කම් නිර්නායකය ඉවත්කර ඇත්තේ බොහෝ ව්‍යවසායවල උපකරණ හා ගොඩනැගිලි වැනි වත්කම් ව්‍යවසායට ම අයත් ඒවා නොව බොහෝ විට බද්දට ලබාගත් ඒවා වූ බැවිනි. නිර්වචනයෙහි සිදුකළ මෙම වෙනසත් සමග ම සුළු හා මධ්‍ය පරිමාණ ලෙස වර්ග කළ ව්‍යවසාය සංඛ්‍යාව 700 - 154,100 දක්වා ඉහළ යෑමට හේතු විය. ඉන්දියානු රජය ද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සම්බන්ධයෙන් 2006 පැවති වත්කම් මත පදනම් වූ නිර්ණායකය 2015 දී වෙනස්කර ඇත. ඒ අනුව සේවා අංශය සම්බන්ධයෙන් පැවති නිර්ණායකය වූ වත්කම් වටිනාකම ඉන්දියානු රුපියල් මිලියන 150 දක්වා (ඩොලර් මිලියන 2.26ක් පමණ) තුන් ගුණයකින් ද නිෂ්පාදන කර්මාන්ත ව්‍යවසායවල වත්කම් වටිනාකම ඉන්දියානු රුපියල් මිලියන 300ක් දක්වා තුන් ගුණයකින් ද ඉහළ නැංවී ය.

යුරෝපා සංගමය ද ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය පිළිබඳ 1996 දී ඉදිරිපත් කළ නිර්වචනය 2005 දී වෙනස් කළේ ය. එහි දී පිරිවැටුම සම්බන්ධ නිර්ණායකය වෙනස් කරන ලද අතර ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායවල පිරිවැටුම යුරෝ මිලියන 2, සුළු පරිමාණ ව්‍යවසායවල පිරිවැටුම යුරෝ මිලියන 10 සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය පිරිවැටුම යුරෝ මිලියන 50 ලෙසත් නිර්වචනය කර ඇත. (02 වැනි වගුව)

ශ්‍රී ලංකාවේ කර්මාන්ත හා වෙළෙඳ අමාත්‍යාංශය විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා 2015 වසරෙහි ජාතික ප්‍රතිපත්ති රාමුවක් හඳුන්වා දෙන ලද අතර ව්‍යවසාය වර්ගීකරණයේ දී සේවකයින් සංඛ්‍යාව සහ වාර්ෂික පිරිවැටුම පදනම්කර ගනී. (03 වැනි වගුව) එය ආර්ථිකය, නිෂ්පාදන

**02 වැනි වගුව**

**යුරෝපා සංගමයෙහි ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය නිර්වචනය**

| ව්‍යවසාය පරිමාව | සේවක සංඛ්‍යාව | පිරිවැටුම | වත්කම්/ වගකීම් |
|---|---|---|---|
| ක්ෂුද්‍ර | 10ට අඩු | යුරෝ මිලියන 2ට අඩු | යුරෝ මිලියන 2ට අඩු |
| සුළු | 50ට අඩු | යුරෝ මිලියන 10ට අඩු | යුරෝ මිලියන 10ට අඩු |
| මධ්‍ය | 250ට අඩු | යුරෝ මිලියන 50ට අඩු | යුරෝ මිලියන 43ට අඩු |

මූලාශ්‍රය - Annual Report on European SMEs 2015/2016, European Commission

කර්මාන්ත සහ සේවා අංශය ලෙස කොටස් දෙකකට බෙදා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ලෙස වර්ග කරයි.

ශ්‍රී ලංකාවේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2013/2014 වසරෙහි දියත් කරන ලද ආර්ථික සංගණනයේ දෙවැනි අදියරේ දී කර්මාන්ත, වෙළෙඳ සහ සේවා කටයුතු සංගණනය කරන ලද අතර එහි දෙ වැනි අදියරේ දත්ත පදනම් කරගනිමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය පිළිබඳ සියලු ම ආයතනවලට පොදුවේ පිළිගත හැකි නිර්ණායකයක් ඉදිරිපත් කර ඇත. මෙහි දී ව්‍යවසාය වර්ගීකරණයෙහිලා පිරිවැටුම, වත්කම්වල වටිනාකම සහ

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල ආර්ථික වැදගත්කම**

පරිමාව අනුව ව්‍යවසාය වර්ගීකරණයේ දී එක හා සමාන පිළිවෙතක් අනුගමනය නොකළ ද පොදුවේ සෑම රටකම පාහේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල ඇති වැදගත්කම බොහෝ දුරට සමාන බව දක්නට ලැබේ. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල ආර්ථික වැදගත්කම, සමස්ත ව්‍යවසාය සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය, දළ දේශීය නිෂ්පාදිතය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල දායකත්වය සේවා නියුක්තිය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ සහ අපනයන ඉපයීම් සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල දායකත්වය යන සංරචක යටතේ විමසා බැලිය හැකි ය. (01 වැනි සංඛ්‍යා සටහන)

**03 වැනි වගුව**

**ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වර්ගීකරණය**

| අංශය | නිර්ණායකය | ව්‍යවසාය පරිමාව | | |
|---|---|---|---|---|
| | | ක්ෂුද්‍ර | සුළු | මධ්‍ය |
| නිෂ්පාදන කර්මාන්ත | වාර්ෂික පිරිවැටුම | රු. මිලියන 15 අඩු | රු. මිලියන 16 - 250 | රු. මිලියන 251-750 |
| | සේවක සංඛ්‍යාව | රු. මිලියන 10 අඩු | රු. මිලියන 11 - 50 | රු. මිලියන 51 - 300 |
| සේවා අංශය | වාර්ෂික පිරිවැටුම | රු. මිලියන 15 අඩු | රු. මිලියන 16- 250 | රු. මිලියන 251- 750 |
| | සේවක සංඛ්‍යාව | රු. මිලියන 10 අඩු | රු. මිලියන 11- 50 | රු. මිලියන 51 - 200 |

මූලාශ්‍රය - National Policy Framework for Small and Medium Enterprise (SME) Development - Ministry of Industry and Commerce



ව්‍යවසායට සම්බන්ධ සේවක සංඛ්‍යාව අත්‍යවශ්‍ය විචල්‍යන් ලෙස හඳුනාගෙන ඇත. ව්‍යවසාය අර්ථ දැක්වීමෙහිලා ඉතාමත් ම යෝග්‍ය සහ වඩාත් ම විශ්වසනීය විචල්‍ය ලෙස හඳුනාගෙන ඇත්තේ ව්‍යවසායේ නියුතු සේවක සංඛ්‍යාවයි. එහෙත් ව්‍යවසාය වර්ගීකරණයේ දී ආර්ථිකය කර්මාන්ත හා ඉදිකිරීම්, වෙළෙඳ සහ සේවා ලෙස අංශ තුනකට බෙදා ඒ ඒ අංශවල සේවක ව්‍යාප්තියේ පවත්නා වෙනස්කම් පිළිබඳ ව අවධානය යොමුකරමින් ක්ෂුද්‍ර, සුළු, මධ්‍ය හා මහා පරිමාණ ව්‍යවසාය සඳහා පහත සඳහන් නිර්වචනය (04 වැනි වගුව) ඉදිරිපත් කර ඇත.

**04 වැනි වගුව**

**ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු, මධ්‍ය හා මහා පරිමාණ ව්‍යවසාය වර්ගීකරණය**

| ආර්ථික අංශය | ව්‍යවසාය කාණ්ඩය | සේවක සංඛ්‍යාව |
|---|---|---|
| කර්මාන්ත සහ ඉදිකිරීම් | ක්ෂුද්‍ර | 01-04 |
| | සුළු | 05-24 |
| | මධ්‍ය | 25-199 |
| | මහා | 200 සහ ඊට වැඩි |
| වෙළෙඳ | ක්ෂුද්‍ර | 01-03 |
| | සුළු | 04-14 |
| | මධ්‍ය | 15-34 |
| | මහා | 35 සහ ඊට වැඩි |
| සේවා | ක්ෂුද්‍ර | 01-04 |
| | සුළු | 05-15 |
| | මධ්‍ය | 16-74 |
| | මහා | 75 සහ ඊට වැඩි |

මූලාශ්‍රය - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

1 වැනි සංඛ්‍යා සටහන

## තෝරාගත් රටවල් කිහිපයක ව්‍යවසාය, සේවා නියුක්තිය, නිෂ්පාදනය සහ අපනයනය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල දායකත්වය

| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල දායකත්වය % | | | | |
|---|---|---|---|---|
| | ව්‍යවසාය සඳහා | දළ දේශීය නිෂ්පාදිතය සඳහා | අපනයන සඳහා | සේවා නියුක්තිය සඳහා |
| කසකස්තානය | 97.5 (2014) | 26.0 (2013) | - | 32.1 (2014) |
| කිර්ගිස්තානය | 97.7 (2013) | 12.0 (2013) | - | 3.9 (2013) |
| චීනය | 97.3 (2013) | 60.0 (2013) | 41.5 (2012) | 64.7 (2011) |
| ජපානය | 99.7 (2012) | 43.7 (2012)* | - | 69.7 (2012) |
| කොරියානු ජනරජය | 99.9 (2012) | 47.6 (2012)** | 18.8 (2012) | 89.9(2012) |
| සිංගප්පූරුව | 99.4 (2012) | 45.0 (2012) | - | 68.0 (2012) |
| බංගලාදේශය | 90.0 (2013) | 25.0 (2014) | - | 75.5 (2014) |
| ඉන්දියාව | 79.9 (2013) | 37.5 (2013) ** | 42.4 (2013) | - |
| ශ්‍රී ලංකාව | 99.8 (2013) | 52.0 (2015) | 20.0 (2013) | 45.0 (2015) |
| කාම්බෝජය | 99.8 (2014) | - | - | 71.8 (2014) |
| ඉන්දුනීසියාව | 99.9 (2013) | 60.0 (2013) | 15.7 (2013) | 97.0 (2013) |
| ලාඕසය | 99.8 (2013) | - | - | 82.9 (2013) |
| මැලේසියාව | 97.3 (2010) | 33.1 (2013) | - | 57.5 (2013) |
| පිලිපීනය | 99.6 (2012) | 35.7 (2006)*** | - | 64.9 (2012) |
| තායිලන්තය | 97.2 (2013) | - | 25.5 (2013) | 81.0 (2013) |
| වියට්නාමය | 97.7 (2012) | - | | 46.8 (2012) |

මූලාශ්‍ර - Asia SME Finance Monitor 2014, Annual Report 2015 - Ministry of Finance - Sri Lanka, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,
Performance Report 2013 - Department of Development Finance - Ministry of Finance - Sri Lanka

සටහන - කොරියානු ජනරජය, ඉන්දියාව, ශ්‍රී ලංකාව, කාම්බෝජය, ඉන්දුනීසියාව, මැලේසියාව, පිලිපීනය, වියට්නාමය යන රටවල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය හැරුණු විට ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසාය ද ඇතුළත්ය.

* විකුණුම් වටිනාකම

** නිෂ්පාදනයේ එකතු කළ අගය (MVA - Manufacturing Value Added)

***දළ එකතු කළ අගය (GVA - Gross Value Added)

## සමස්ත ව්‍යවසාය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල දායකත්වය

ව්‍යවසාය සංඛ්‍යාව පිළිබඳව විමසා බැලීමේ දී පහළ සහ පහළ මැදි ආදායම් ලබන රටවල මෙන්ම ඉහළ ආදායම් ලබන රටවල ද ව්‍යවසාය සඳහා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල නියෝජනය සියයට 99 ද ඉක්මවා ඇති බව දක්නට ලැබේ. 2012 වසරෙහි කොරියානු ජනරජයෙහි ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංඛ්‍යාව මිලියන 3.35ක් විය. එය පෙර වසරට සාපේක්ෂව සියයට 3.7 ඉහළ යෑමකි. 2013 වසරේ චීනයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංඛ්‍යාව පෙර වසරට සාපේක්ෂව සියයට 2.6කින් වර්ධනය වී ඇත. එය සමස්ත කාර්මික ව්‍යවසායවලින් සියයට 97.3






ප්‍රතිශතයකි. 2014 වසරෙහි කසකස්තානයෙහි ලියාපදිංචි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංඛ්‍යාව 1,594,317ක් විය. එය පෙර වසරට සාපේක්ෂ ව සියයට 3.4 ඉහළ යෑමකි. 2013 වසරේ බංගලාදේශයේ පෞද්ගලික ව්‍යවසාය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල දායකත්වය සියයට 90ක් විය. ව්‍යවසාය සංඛ්‍යාව මිලියන 7.2කි. ක්ෂුද්‍ර පරිමාණයේ ව්‍යවසාය සංඛ්‍යාව ද එක්කළ විට එය මිලියන 7.9ක් වූ අතර එවිට ව්‍යවසාය සඳහා දායකත්වය සියයට 99ක් විය. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය එක් කාණ්ඩයක් ලෙස ගෙන විමසා බැලුවත් ඒ තුළ මධ්‍ය පරිමාණ ව්‍යවසායවල නියෝජනය ඉතා කුඩා කොටසක් බැව් දක්නට ලැබේ. ශ්‍රී ලංකාවේ සමස්ත ව්‍යවසාය තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල නියෝජනය පිළිබඳව විමසා බැලීමේ දී 2013/14 ආර්ථික සංගණනයෙන් අනාවරණය වී ඇති තොරතුරු ඉතා වැදගත් වේ. එම සංගණනයේ දී කෘෂිකාර්මික නො වන කටයුතුවල නියැලි ආයතන ව්‍යවසාය යටතට ගැනී ඇත. ඒ අනුව කෘෂිකාර්මික නො වන ආර්ථික කටයුතුවල නියැලි සමස්ත ආයතන සංඛ්‍යාව 1,019,681ක් විය. ඉන් මහා පරිමාණ ව්‍යවසාය යටතට ගැනී ඇත්තේ ආයතන 2,414කි. ප්‍රතිශතය සියයට 0.2කි. (1 වැනි රූප සටහන) මධ්‍ය පරිමාණ ව්‍යවසායවල ප්‍රතිශතය සියයට 1කි. සියයට 92ක් පමණ වූ ඉහළ ම ප්‍රතිශතය වාර්තා වී ඇත්තේ ක්ෂුද්‍ර පරිමාණයේ ව්‍යවසාය කාණ්ඩයෙනි. මහා පරිමාණ ව්‍යවසායවල ප්‍රතිශතය අත් හැර අනෙක් ව්‍යවසාය සියල්ල ගත්විට එම ප්‍රතිශතය සියයට 99 ද ඉක්මවා යෑමෙන් ශ්‍රී ලංකා ආර්ථිකය තුළ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ඉටුකරන කාර්යභාරය කෙතරම් ද යන්න මැනවින් පැහැදිලි වේ.

ඉන්දියාව ලොව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංඛ්‍යාවෙන් දෙවැනි තැන පසුවෙයි. 2014 වසරෙහි එහි ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංඛ්‍යාව මිලියන 48.8ක් පමණ විය. එය පෙර වසරට සාපේක්ෂ ව සියයට 4.4 වර්ධනයකි. 2015 වසරෙහි යුරෝපා සංගමයට අයත් සාමාජික රටවල ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංඛ්‍යාව මිලියන 23ක් වූ අතර සමස්ත ව්‍යවසාය සඳහා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල දායකත්වය සියයට 99.8ක් විය. ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායවල ප්‍රතිශතය සියයට 92.8ක් වූ අතර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල දායකත්ව ප්‍රතිශත පිළිවෙළින් සියයට 6.0ක් හා සියයට 1.0ක් විය. 2015 වසරෙහි එක්සත් ජනපදයේ සමස්ත ව්‍යවසාය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල නියෝජනය සියයට 98.9ක් විය.

1 වැනි රූපසටහන

**ශ්‍රී ලංකාවේ ව්‍යවසාය සඳහා ක්ෂුද්‍ර, සුළු, මධ්‍ය හා මහා පරිමාණ ව්‍යවසායවල දායකත්වය**




මූලාශ්‍රය - ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ජාතික නිෂ්පාදනය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල දායකත්වය

රටක ආර්ථික සංවර්ධනය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල වැදගත්කම විමසා බැලීමේ දී ආර්ථිකයේ නිෂ්පාදනයට දක්වන දායකත්වය ද විමසා බැලිය යුතු වේ. බොහෝ රටවල් නිෂ්පාදනය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල දායකත්වය කොතෙක් ද යන්න විමසා බැලීමේ දී ඒ සඳහා දළ දේශීය නිෂ්පාදිතය පදනම් කරගන්නා බැව් දක්නට ලැබේ. එහෙත් ජපානය ඒ සඳහා විකුණුම් වටිනාකම පදනම්කර ගනී. කොරියානු ජනරජය සහ ඉන්දියාව නිෂ්පාදනයේ එකතු කළ අගය පදනම් කර ගනී. පිලිපීනය දළ එකතු කළ අගය පදනම් කරගනී.

දළ දේශීය නිෂ්පාදිතය සඳහා 2013 වසරේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල දායකත්වයේ ඉහළ ම අගය වූ සියයට 60 වාර්තා වී ඇත්තේ චීනයෙන් සහ ඉන්දුනීසියාවෙනි. දේශීය වශයෙන් හා ගෝලීය ව පැවති අයහපත් ආර්ථික පරිසරය තුළ වුව ද 2014 වසරේ බංගලාදේශ ආර්ථිකය සියයට 6කින් පමණ වර්ධනය විය. එපමණක් නොව එය 2014 වසරේ ලොව වේගයෙන් ම වර්ධනය වන නැගී එන ආර්ථික 5 අතර සිව්වැන්නා විය. ඊට බෙහෙවින් හේතු වී ඇත්තේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවලින් බොහෝ දුරට සමන්විත වන නිෂ්පාදන අංශයේ වේගවත් වර්ධනයයි. සමස්ත ව්‍යවසාය සඳහා 2013 වසරේ සියයට 90කින් දායකවී ඇති බංගලාදේශයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය 2014 වසරේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 25ක ප්‍රතිශතයකින් දායක වී ඇත.

2015 වසරේ යුරෝපා සංගමයට අයත් සාමාජික රටවල් 28හි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මගින් යුරෝපා සංගමයෙහි නිෂ්පාදනය සඳහා එකතු කළ වටිනාකම යුරෝ ට්‍රිලියන 3.9කි. නිෂ්පාදනයේ එකතු කළ අගය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල නියෝජනය ප්‍රතිශතයක් ලෙස ගත්විට 57.4ක් විය. 2015 වසරෙහි එක්සත් ජනපදයෙහි නිෂ්පාදනය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල දායකත්වය සියයට 53.3ක් විය.

## අපනයක ඉපයීම් සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල දායකත්වය

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල ආර්ථික වැදගත්කම පිළිබඳව විමසා බැලීමේ දී අපනයන සඳහා ඒවායින් කෙරෙන දායකත්වය පිළිබඳව ද විමසා බැලීම වැදගත් වේ.

සමස්ත ව්‍යවසාය සඳහා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල දායකත්වය ඉහළ අගයක් ගත්ත ද ඒවා ඇතැම් රටවල ආර්ථික සංවර්ධනය සඳහා ඒ හා සමාන හෝ ඊට ආසන්න ප්‍රතිශතයකින් හෝ දායක නොවන බැව් සංඛ්‍යා සටහනින් පැහැදිලි වේ. උදාහරණ වශයෙන් 2012 වසරේ කොරියානු ජනරජයේ සමස්ත ව්‍යවසාය සඳහා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල දායකත්වය සියයට 99.9ක් වුව ද ඒවා අපනයන ආදායම සඳහා දායක වී ඇත්තේ සියයට 18.8කිනි. එ මෙන් ම 2013 වසරේ ව්‍යවසාය සඳහා සියයට 99.9 දායකත්වයක් දැක්වූ ඉන්දුනීසියාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ද අපනයන ආදායම සඳහා දායක වී ඇත්තේ සියයට 15.7කිනි. 2012 චීනයෙහි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අපනයන සඳහා චීන යුවාන් බිලියන 4,423කින් දායකවී ඇත. 2013 වසරේ ඉන්දියාවේ ක්ෂුද්‍ර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල අපනයන නිෂ්පාදන වටිනාකම ඉන්දියානු රුපියල් ට්‍රිලියන 693ක් විය. එය 2012 වසරට සාපේක්ෂ ව සියයට 9.9 ඉහළ යෑමකි.

කෙසේ වෙතත් අපනයන සඳහා දායකත්වයේ ප්‍රතිශතය පහළ අගයක් ගත්තා වුවත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවලින් ආර්ථිකයට ඇති වැදගත්කම ඉන් අවතක්සේරු කළ නො හැකි ය. මන්ද අපනයනයට යොමු නො කෙරෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල නිෂ්පාදන දේශීය පරිභෝජනය සඳහා යොදා ගැනෙන බැවින් එය එක්තරා ආකාරයකින් විදේශ විනිමය ඉතිරි කර ගැනීමට ඉවහල් විය හැකි බැවිනි.

## සේවා නියුක්තිය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල දායකත්වය

සේවා නියුක්තිය ද ආර්ථික සංවර්ධනයෙහිලා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල දායකත්වය විමසා බැලීමේ විශේෂ සංරචකයක් වේ. ලෝක කම්කරු සංවිධානයට අනුව 2015 වසරෙහි ලොව රැකියා වියුක්ත ජනගහනය මිලියන 204 ඉක්මවී ය. එ මෙන් ම 2016-2030 වන විට ලෝක ශ්‍රම බලකායට අලුතින් ඇතුළුවන්නන් සඳහා නව රැකියා අවස්ථා මිලියන 470ක්, එනම් වසරකට මිලියන 30ක් පමණ රැකියා ජනනය කළ යුතුව ඇතැයි එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ඇස්තමේන්තු කර ඇත. මෙසේ වැඩිවන රැකියා ඉල්ලුම සපුරාලීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවලින් ලබාගත හැකි පිටුබලය සැලකිල්ලට ගනිමින් එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන අභිමතාර්ථ අතර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය කෙරෙහි ද අවධානය යොමුකර ඇත.

සෑම රටක ම පාහේ ශ්‍රම වෙළෙඳපොළේ රැකියා ජනනය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සැලකිය යුතු දායකත්වයක් දක්වයි. එහෙත් මහා පරිමාණ ව්‍යවසාය සංඛ්‍යාව අතින් ඉතා සුළු කොටසක් නියෝජනය කළ ද රැකියා ජනනය සඳහා ඒවායේ දායකත්වය ඉහළ අගයක් ගනී. ජපානයේ ව්‍යවසායවලින් සියයට 87ක සේවක සංඛ්‍යාව 5ට වඩා අඩුය. යුරෝපා සංගමයේ සමස්ත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවලින් සියයට 93ක් සේවකයින් සංඛ්‍යාව 10ට අඩු ක්ෂුද්‍ර පරිමාණයේ ඒවා ය. 2015 වසරේ යුරෝපා සංගමයට අයත් සාමාජික රටවල ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල සේවා නියුක්තිය මිලියන 90ක් වූ අතර සමස්ත සේවා නියුක්තිය සඳහා දායකත්වය සියයට 67ක් විය. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල ප්‍රතිශත පිළිවෙළින් සියයට 30, සියයට 20 හා සියයට 17ක් විය. 2015 වසරේ එක්සත් ජනපදයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සේවා නියුක්තිය සඳහා සියයට 52.0කින් දායක වී ඇත. 2012 වසරේ කොරියානු ජනරජයේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල සේවා නියුක්තිය මිලියන 13ක් වූ අතර එය මුලු සේවා නියුක්තියෙන් සියයට 89.9 ප්‍රතිශතයකි. එමෙන්ම ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල සේවා නියුක්තිය පෙර වසරට සාපේක්ෂව සියයට 3.4න් ඉහළ ගොස් ඇත. 2013 වසරෙහි ඉන්දියාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල සේවා නියුක්තිය මිලියන 106.1ක් වූ අතර 2014 වසරෙහි එය සියයට 4.9කින් වර්ධනය වෙමින් මිලියන 113.3ක් ව ඇත. චීනයෙහි විශාලතම රැකියා උත්පාදන මාර්ගය සුළු හා මධ්‍ය පරිමාණ




ව්‍යවසාය යි. 2011 වසරෙහි එ රට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල සේවා නියුක්තිය මිලියන 59ක් විය. 2014 ඉන්දියාවෙහි ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසව්‍යවසායවල සේවා නියුක්තිය මිලියන 80.5ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

ශ්‍රී ලංකාවේ රැකියා ජනනය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල දායකත්වය සියයට 45කි. ව්‍යවසාය අතර මහා පරිමාණ ව්‍යවසායවල නියෝජනය සියයට 0.2ක් පමණ වුව ද ව්‍යවසායවල සේවා නියුක්තියෙන් සියයට 25ක් තරම් ප්‍රතිශතයක් මහා පරිමාණ ව්‍යවසාය නියෝජනය කරයි. ව්‍යවසාය සංඛ්‍යාවෙන් සියයට 8ක් පමණ නියෝජනය කළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සියයට 31ක් පමණ ප්‍රතිශතයකින් ව්‍යවසායවල රැකියා ජනනය සඳහා දායක වී ඇත. (2 වැනි රූපසටහන)

2 වැනි රූප සටහන

**ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු, මධ්‍යම හා මහා පරිමාණ ව්‍යවසායවල රැකියා නියුක්තිය**




මූලාශ්‍රය - ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මෙසේ ආර්ථික සංවර්ධනයෙහිලා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල වැදගත්කම විවිධ දෘෂ්ටි කෝණවලින් විමසා බැලිය හැකි බව පැහැදිලි වේ. එය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය දිරිගැන්වීමේ ප්‍රවර්ධන වැඩසටහන් සැලසුම් කිරීමේ දී හා ප්‍රතිපත්ති සම්පාදනයේ දී වඩාත් ඵලදායී තීරණ ගැනීමට හේතුවනවා ඇත. එනම් ප්‍රවර්ධනය කළ යුතු අංශ හඳුනාගැනීමටත් ඒවා ප්‍රවර්ධනය කිරීමෙහිලා ගත යුතු ක්‍රියාමාර්ග හඳුනාගැනීමටත් එය බෙහෙවින් ඉවහල් වනු ඇත.

**ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රයේ පවත්නා ගැටලු**

සෑම රටක ම පාහේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය බොහෝදුරට එක සමාන ආකාරයේ ගැටලු කිහිපයකට මුහුණ දෙයි. මෙම ගැටලු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රවර්ධනයට බාධා ඇති කරයි. මෙම බාධා ඇතැම් විට ව්‍යවසාය තුළින් ම ජනිත වන අතර ඇතැම් බාධා ව්‍යවසායෙන් බැහැර ව ඇති විය හැකි ය. උදාහරණ වශයෙන් පළපුරුද්ද හා කුසලතා සහිත කාර්යක්ෂම සේවක හිඟය, මූල්‍ය සාක්ෂරතාව, මූල්‍ය කළමනාකරණය, ගිණුම්කරණය හා අලෙවිකරණය පිළිබඳ දැනුම ප්‍රමාණවත් නොවීම ආදිය ව්‍යවසාය ප්‍රවර්ධනයට බාධා ඇති කරන අභ්‍යන්තර ගැටලු වන අතර ව්‍යාපාරික අවස්ථාවල හිඟකම, වෙළෙඳපොළ සීමිත බව, බැංකු හා මූල්‍ය ආයතන ඇතුළු යටිතල පහසුකම් ප්‍රමාණවත් නො වීම, නෛතික ගැටලු ආදිය බාහිර බාධක ලෙස දැක්විය හැකි ය.

ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර හා සුළු පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රයේ පවත්නා ගැටලු පිළිබඳ ව විමසා බැලීමේ දී ආයතන ලියාපදිංචිය පිළිබඳ ව පවත්නා මන්දෝත්සාහි බව කැපී පෙනෙන එක් ගැටලුවකි. ශ්‍රී ලංකාවේ සියලු ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ආර්ථික ක්‍රියාකාරකම්වල නිරත ආයතන ලියාපදිංචිය සඳහා පහසුකම් සලසා ඇත. 2013/14 ආර්ථික සංගණනයට අනුව ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ක්ෂුද්‍ර, සුළු, මධ්‍ය හා මහා පරිමාණ ව්‍යවසාය සංඛ්‍යාව 1,019,681ක් වුවත් ඉන් ලියාපදිංචිවී ඇති ආයතනවල ප්‍රතිශතය සියයට 57.6ක් පමණ වේ. ලියාපදිංචි වූ මධ්‍ය හා මහා පරිමාණ ව්‍යවසායවල ප්‍රතිශතය සියයට 100ක් වුව ද ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායවලින් ලියාපදිංචි වී ඇත්තේ සියයට 55ක් පමණ ප්‍රතිශතයකි. සුළු පරිමාණ ව්‍යවසායවල එම ප්‍රතිශතය සියයට 89 ක් පමණ විය. 2013/14 ආර්ථික සංගණනයට අනුව ක්ෂුද්‍ර හා සුළු පරිමාණ ව්‍යවසාය ලියාපදිංචියේ අඩුම ප්‍රතිශත වූ සියයට 41 හා සියයට 78 වාර්තා වී ඇත්තේ පුත්තලම් දිස්ත්‍රික්කයෙනි. එ මෙන් ම ක්ෂුද්‍ර හා සුළු පරිමාණ ව්‍යවසාය ලියාපදිංචියේ ඉහළ ම ප්‍රතිශත වූ සියයට 71.8 හා සියයට 94.3 වාර්තා වී ඇත්තේ කිලිනොච්චි දිස්ත්‍රික්කයෙනි. ව්‍යවසාය ලියාපදිංචි නො කිරීමේ තත්ත්වය ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සම්බන්ධ ගැටලු හඳුනා ගැනීමට, ප්‍රතිපත්ති තීරණ ගැනීමට, නොයෙකුත් දිරිගැන්වීම් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට බාධාවක්ව පවතී. ව්‍යාපාර ලියාපදිංචිය හා එම ආයතනවල නෛතික තත්ත්වය රටක සමස්ත ආර්ථිකයේ ස්වරූපය නිරූපනය කිරීමට යොදා ගන්නා දර්ශකයකි.

එ මෙන් ම මූල්‍ය ගනුදෙනු ගිණුම්ගත නො කිරීම ද ක්ෂුද්‍ර හා සුළු පරිමාණ ව්‍යවසාය සම්බන්ධ ව දක්නට ලැබෙන ගැටලුවකි. නිවැරදි ව ගනුදෙනු වාර්තා නො කිරීම තුළින් ව්‍යවසායේ ආදායම්, වියදම්, ලාභ, පාඩු පිළිබඳ ව මෙන් ම එහි පැවැත්ම හා අනාගතය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාගත නො හැකි ය. 2013/2014 ආර්ථික සංගණනයෙන් අනාවරණය වන පරිදි ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර පරිමාණයේ ව්‍යවසායවලින් ඔවුන්ගේ මූල්‍ය ගනුදෙනු වාර්තා තබා ඇති ව්‍යවසායවල ප්‍රතිශතය සියයට 26ක් පමණි. සුළු පරිමාණ ව්‍යවසාය සම්බන්ධව එම ප්‍රතිශතය සියයට 72කි.

ව්‍යවසාය ආරම්භ කිරීම සඳහා මෙන් ම එය පවත්වාගෙන යෑම සඳහා ද නොයෙකුත් නීති පිළිබඳ දැනුම්වත් ව සිටිය යුතු ය. උදාහරණ වශයෙන් කම්කරු නීති, පාරිභෝගික නීති, පරිසර නීති ආදිය දැක්විය හැකි ය. මෙම නීති පිළිබඳ ව මූලික දැනුමකින් තොරව ව්‍යවසාය කරගෙන යෑමේ දී ඇතැම් විට ගැටලුවලට මුහුණපෑමට සිදුවන අතර එහි දී ව්‍යවසායට නීතිමය රැකවරණක් ලැබීමේ අවස්ථාව මඟහැරී යයි.

නූතන තාක්ෂණයෙන් ප්‍රමාණවත් ප්‍රතිලාභ ලැබීමට උත්සුක නො වීම ද ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර හා සුළු පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රයේ දක්නට ලැබෙන ගැටලුවකි. සාම්ප්‍රදායික නිෂ්පාදනවල යෙදෙන අය අතර මෙම තත්ත්වය කැපී පෙනේ. නිෂ්පාදනයේ අනන්‍යතාව සුරැකෙන අතර ම නව තාක්ෂණය භාවිතයෙන් නිෂ්පාදනය වැඩි දියුණු කිරීමට ඇති අවස්ථා මඟ හැරීමෙන් වෙළෙඳපොළ තරඟයට මුහුණදීමට ශක්තියක් නැතිවිය හැකි ය. එ මෙන් ම වෙළෙඳපොළ අවස්ථා මඟහැරී යෑමට ද ඉඩ ඇත. කෙසේ වෙතත් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් තාක්ෂණය භාවිතයෙන් වැඩි දියුණු කරන ලද දේශීය නිෂ්පාදන මඟින් විදේශ වෙළෙඳපොළ අවස්ථා හිමි කරගැනීම ද දක්නට ලැබේ. නිෂ්පාදනයේ දී නව සහ වැඩි දියුණු කරන ලද තාක්ෂණ භාවිතාවන් සහ ව්‍යවසාය උපදේශන පිළිබඳ දැනුම ව්‍යවසායකයින් හට ලබා දෙන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන කිහිපයක් ම ඇත. උදාහරණයකිඃ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, නිපුණතා පියස, කාර්මික සංවර්ධන මණ්ඩලය, ජාතික ශිල්ප සභාව, ලෙස ජාතික මෝස්තර මධ්‍යස්ථානය දැක්විය හැකි ය.

**ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර හා සුළු පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රයේ පවත්නා ගැටලු පිළිබඳ ව විමසා බැලීමේ දී ආයතන ලියාපදිංචිය පිළිබඳව පවත්නා මන්දෝත්සාහි බව කැපී පෙනෙන එක් ගැටලුවකි. ශ්‍රී ලංකාවේ සියලු ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ආර්ථික ක්‍රියාකාරකම්වල නිරත ආයතන ලියාපදිංචිය සඳහා පහසුකම් සලසා ඇත.**




එ මෙන් ම ව්‍යවසාය ආරම්භය හා ප්‍රවර්ධනය සඳහා අරමුදල් සම්පාදනයේ දී වඩාත් වාසිදායක මාර්ග පිළිබඳ ව නො දැනුවත් බව ද ක්ෂේත්‍රයේ පවත්නා ගැටලුවකි. ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර සහ සුළු පරිමාණ ව්‍යවසාය රැසක් ග්‍රාමීය ප්‍රදේශවල කේන්ද්‍රගත ව ඇති බවක් දක්නට ලැබේ. 2013/14 ආර්ථික සංගණනයට අනුව ක්ෂුද්‍ර පරිමාණයේ ව්‍යවසායවලින් සියයට 75ක් පමණ ද සුළු පරිමාණයේ ව්‍යවසායවලින් සියයට 60 ක් පමණ ද ග්‍රාමීය අංශයේ ස්ථාපිතව තිබිණි. සාපේක්ෂ ව ගත්විට ක්ෂුද්‍ර හා සුළු පරිමාණ ව්‍යවසාය සඳහා අරමුදල් සපයන ඇතැම් බැංකු සහ විධිමත් මූල්‍යායතනවල ව්‍යාප්තිය ප්‍රමාණවත් පරිදි ග්‍රාමීය ප්‍රදේශ කරා ළඟා නො වී තිබීම ක්ෂුද්‍ර හා සුළු පරිමාණ ව්‍යවසායකයන් මූල්‍ය පහසුකම් ලබාගැනීමේ දී මුහුණපාන ගැටලුවකි.

අනෙක් අතට ක්ෂුද්‍ර හා සුළු පරිමාණ ව්‍යවසාය සඳහා ණය මුදල් සැපයීමට මූල්‍යායතන දක්වන මන්දෝත්සාහී බව ද ව්‍යවසායකයින් මුහුණ දෙන ගැටලුවකි. ප්‍රමාණවත් ඇප සුරැකුම් ඉදිරිපත් කිරීමට අපොසත්වීම මෙයට බොහෝ විට හේතු වේ. මෙම තත්ත්වය යම්තාක් දුරට මඟහරවාලමින් තුළිත ආර්ථිකයට මඟ පාදනු වස් ශ්‍රී ලංකා මහ බැංකුව සහභාගිත්ව මූල්‍ය ආයතන හරහා ණය අවශ්‍ය ව්‍යවසායකයන් කරා ණය ගලායෑම් විධිමත් කරනු පිණිස ප්‍රති මූල්‍ය ණය යෝජනා ක්‍රම, පොලී අනුපාත සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරයි.

### ආශ්‍රිත ග්‍රන්ථ

1. Annual Report 2015 - Ministry of Finance - Sri Lanka
2. Annual Report on European SMEs 2015/2016
   SME recovery continues, European Commission
3. Asia SME Finance Monitor 2014 Asian Development Bank
4. http://www.un.org
5. National Policy Framework for Small and Medium Enterprise (SME) Development - Ministry of Industry and Commerce
6. Non-Agricultural Economic Activities in Sri Lanka
   Economic Census 2013/2014
   Listing Phase
   Department of Census and Statistics
7. Performance Report 2013
   Department of Development Finance
   Ministry of Finance - Sri Lanka
8. World Trade Report 2016
   Leveling the trading field for SMEs
   World Trade Organization

# ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය උදෙසා ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය

**චතුර රත්නායක**
**ප්‍රාදේශීය කාර්යාලය - මාතලේ**

**මහේෂී විතාන**
**සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව**

**හැඳින්වීම**


සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින බොහෝ රටවල ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සමාජීය මෙන් ම ආර්ථික වශයෙන් ද ඉතා වැදගත් ස්ථානයක් උසුලයි. මේ පිළිබඳ ව විමසා බැලීමේ දී ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආර්ථිකයක සේවා නියුක්තිය හා දළ දේශීය නිෂ්පාදිතය කෙරෙහි සැලකිය යුතු දායකත්වයක් දක්වන බව පැහැදිලි වේ. ශ්‍රී ලංකාවේ සමස්ත ව්‍යාපාර සංඛ්‍යාවෙන් සියයට 75ක් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ය. මේවා දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 52ක ප්‍රතිශතයකින් ද සේවා නියුක්තිය සඳහා සියයට 35ක ප්‍රතිශතයකින් ද දායක වෙයි. ශ්‍රී ලංකාවෙහි මෙන් ම තෝරාගත් කලාපීය රටවල් කිහිපයක ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආර්ථික සංවර්ධනය කෙරෙහි දක්වන දායකත්වය 01 වැනි රූප සටහනින් පැහැදිලි වේ.

විශේෂ අවධානයක් යොමු කරන අතර පෞද්ගලික අංශය විසින් ද නොයෙකුත් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් විට නිදහසින් පසු බලයට පත් සෑම රජයක් විසින් ම පාහේ මෙම ක්ෂේත්‍රය ප්‍රවර්ධනය උදෙසා විශාල ප්‍රයත්නයක් දරා ඇත. එහි දී, බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ සිට පැවති තේ, පොල් හා රබර් නිෂ්පාදනවලින් සමන්විත වූ ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය වෙනස් කරමින් ආර්ථිකයේ වෙනත් නිෂ්පාදන අංශ වෙත අවධානය යොමු කිරීමට පැවති රජයන්ට සිදු විය. ඒ අනුව, සුළු ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමට රජය මැදිහත් විය. විශේෂයෙන් ම, 1960 - 1977 කාල පරාසය තුළ දී ආනයන ආදේශන භාණ්ඩ නිෂ්පාදනය සඳහා රජය විසින් විශේෂ දිරි ගැන්වීමක් සිදු

01 වැනි රූප සටහන

**තෝරාගත් කලාපීය රටවල් කිහිපයක ආර්ථික සංරචක කිහිපයක් කෙරෙහි ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල දායකත්වය**




මූලාශ්‍ර: Contribution of ASEAN-6 SMEs to EconomicGrowth of ASEAN SME Finance Forum

විශේෂයෙන් ම සංවර්ධනය වෙමින් පවත්නා රටවල් දුගීභාවය, ආදායම් ව්‍යාප්ති විෂමතාව හා විරැකියාව වැනි ගැටලුවලට විසඳුම් ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය යොදා ගනී. මේ සඳහා එක් එක් රටවල් විවිධ වැඩ පිළිවෙළවල් අනුගමනය කරයි. රාජ්‍ය අංශයේ ප්‍රතිපත්ති සම්පාදනයේ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කෙරෙහි

කරන ලදී. ඉන්පසු 70 දශකයේ අග භාගයේ සිදු වූ ආර්ථික ප්‍රතිපත්තිවල වෙනස්කම් සමඟ පෞද්ගලික අංශයේ ආයෝජන ඉහළ ගිය අතර එ මගින් ගෘහ භාණ්ඩ හා ගෘහ උපකරණ නිෂ්පාදනය, විශාල සංවර්ධන ව්‍යාපෘති ඉලක්ක කර ගනිමින් ඉදිකිරීම් ද්‍රව්‍ය නිෂ්පාදනය මෙන් ම අත්කම් නිර්මාණ වැනි සංචාරක කර්මාන්තය ඉලක්ක කර ගත් කුඩා

ව්‍යාපාර ද ප්‍රවර්ධනය විය. මෑත කාලීන ව, සුළු පරිමාණ ව්‍යාපාරිකයන් සඳහා මූල්‍ය පහසුකම් සැපයීම, තාක්ෂණ හා කළමනාකරණ කුසලතා වර්ධනය හා ප්‍රාදේශීය වශයෙන් කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා රජය විසින් පියවර ගෙන ඇත.

මෙම ලිපිය මගින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හැඳින්වීම, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙන ඇති පියවර, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ක්‍රියාත්මක ණය යෝජනා ක්‍රම, ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා පවතින අභියෝග හා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය තවදුරටත් සාර්ථක කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ ව සාකච්ඡා කෙරේ.

**ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හැඳින්වීම**

විවිධ රටවල ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විවිධ සංරචක යොදා ගනිමින් පහසුවෙන් හඳුනා ගැනීම සඳහා නිර්වචනය කර බෙදා වෙන් කර ඇත. ශ්‍රී ලංකාව තුළ මෑතක් වන තුරු ම පිළිගත් නිර්වචනයක් නො තිබුණු අතර විවිධ ආයතන විසින් තම අභිලාෂයන් මත විවිධ සංරචක පදනම් කර ගනිමින් මෙම ව්‍යාපාර නිර්වචනය කරන ලදී.

මෑතක දී රජය විසින් හඳුන්වා දෙන ලද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්ති රාමුව, ශ්‍රී ලංකාව තුළ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නිර්වචනය සේවක සංඛ්‍යාව හා වාර්ෂික පිරිවැටුම මත පදනම් ව සිදු කර ඇත. පළමු වගුව මගින් එම නිර්වචන දක්වා ඇත. එ මෙන් ම අනෙකුත් රටවල් ද විවිධ සංරචක මත පදනම් ව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නිර්වචනය කර ඇත. (1 වැනි වගුව)

උදා :- ඉන්දුනීසියාව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නිර්වචනය කර ඇත්තේ වත්කම්වල වටිනාකම හා වාර්ෂික පිරිවැටුම පදනම් කරගෙනයි. බෲනායි, සේවක සංඛ්‍යාව පදනම් කර ගෙන ඇත. මැලේසියාව හා සිංගප්පූරුව, වාර්ෂික විකුණුම් පිරිවැටුම යොදා ගෙන ඇත. මීට අමතර ව ඉන්දියාව යන්ත්‍ර හා පිරියතවල ආයෝජනය හා උපකරණවල ආයෝජනය මත පදනම් ව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නිර්වචනය කර ඇත. (2 වැනි වගුව)

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සැකසීම, ජාතික සංඛ්‍යාන සම්පාදනය, රාජ්‍ය අනුග්‍රහය ලබාදීම සඳහා අඩිතාලමක් සකස් කිරීම හා ව්‍යාපාර ප්‍රවර්ධනයට යොදා ගන්නා ක්‍රමෝපායයන් වඩා තීව්‍ර ලෙස යොදා ගැනීම අරමුණු කර ගනිමින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මෙ ලෙස නිර්වචනය කර ඇත.

1 වැනි වගුව

**ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නිර්වචනය**

| | නිර්ණායක | මධ්‍ය පරිමාණ | කුඩා පරිමාණ | ක්ෂුද්‍ර |
|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශය** | වාර්ෂික පිරිවැටුම | රු.මි. 251 - 750 | රු.මි. 16 - 250 | රු.මි. 15 ට අඩු |
| | සේවකයන් සංඛ්‍යාව | 51 - 300 | 11 - 50 | 10 ට අඩු |
| **සේවා අංශය** | වාර්ෂික පිරිවැටුම | රු.මි. 251 - 750 | රු.මි. 16 - 250 | රු.මි. 15 ට අඩු |
| | සේවකයන් සංඛ්‍යාව | 51 - 200 | 11 - 50 | 10 ට අඩු |

මූලාශ්‍රය: සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්ති රාමුව

2 වැනි වගුව

**ඉන්දියාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නිර්වචනය**

| | නිර්ණායක | මධ්‍ය පරිමාණ | කුඩා පරිමාණ | ක්ෂුද්‍ර |
|---|---|---|---|---|
| නිෂ්පාදන අංශය | යන්ත්‍ර හා පිරියතවල ආයෝජනය | ඇ.ඩො.මි. 1.25 - ඇ.ඩො.මි. 2.5 | ඇ.ඩො. 62500 - ඇ.ඩො.මි. 1.25 | ඇ.ඩො. 62500 දක්වා |
| සේවා අංශය | උපකරණවල ආයෝජනය | ඇ.ඩො.මි. 0.5 - ඇ.ඩො.මි. 1.5 | ඇ.ඩො. 25000 - ඇ.ඩො.මි. 0.5 | ඇ.ඩො. 25000 දක්වා |

මූලාශ්‍ර: Development Commissioner (MSME) - Ministry Of Micro, Small & Medium Enterprises
MSME Definition in India: ThePresent State and the Imperatives

### ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ගෙන ඇති පියවර

බොහෝ රටවල ප්‍රධාන මූල්‍ය නියාමන අධිකාරිය ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා ප්‍රමුඛ ස්ථානයක් ගෙන කටයුතු කරයි. විශේෂයෙන් ම බැංකු හා මූල්‍ය ආයතන නියාමන අධිකාරිය ලෙස එම ආයතනවලින් මූල්‍ය පහසුකම් සැපයීම සඳහා යෝග්‍ය රෙගුලාසි නිකුත් කිරීම තුළින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රයට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කෙරේ. එ සේ ම ශ්‍රී ලංකාව තුළ බැංකු හා මූල්‍ය ආයතන නියාමන බලය හිමි ශ්‍රී ලංකා මහ බැංකුව ද මෙම කාර්යය සිදු කිරීමට මැදිහත් වේ.

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ආරම්භයේ සිට ම ක්‍රියාකාරී දායකත්වයක් ලබා දී ඇති අතර එම ව්‍යාපාරවල සංවර්ධනයට අවශ්‍ය මූල්‍ය දිරිගැන්වීම් ලබා දීමට යෝග්‍ය මූල්‍ය ආයතන ස්ථාපිත කිරීම සඳහා ද මූලිකත්වය දී ඇත. 1970 මුල් යුගයේ සිට ම ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා දිගු කාලීන සහන ණය සේවා ලබා දීමට මූල්‍ය ආයතන දිරි ගැන්වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රති මූල්‍ය ණය යෝජනා ක්‍රම හඳුන්වා දෙන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වර්තමානයේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය සඳහා විවිධ ක්‍රියාකාරකම් රාශියක් සිදු කරනු ලබයි. ඒවා අතර ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ප්‍රතිපත්ති සම්පාදනය, ප්‍රාග්ධන හා ප්‍රතිමූල්‍ය ණය සේවා සම්පාදනය, ණය ආධාර ව්‍යාපෘති සම්බන්ධීකරණය, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සම්බන්ධ තොරතුරු එක් රැස් කිරීම හා බෙදා හැරීම, නිපුණතා සංවර්ධන හා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම, ප්‍රාදේශීය වශයෙන් වෙළෙඳ ප්‍රදර්ශන පැවැත්වීම යනාදිය ප්‍රමුඛ ස්ථානයක් ගනී.

### ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ක්‍රියාත්මක ණය යෝජනා ක්‍රම

ශ්‍රී ලංකා මහ බැංකුව මගින් වර්තමානයේ දී ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම හා ණය සහතික කිරීමේ යෝජනා ක්‍රම රැසක් සහභාගිත්ව මූල්‍ය ආයතන (Participatory Financial Institutions) හරහා ක්‍රියාත්මක කරමින් පවතී. 3 වැනි වගුව මගින් ඒවායේ කාර්යයන් දක්වා ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ක්‍රියාත්මක ණය යෝජනා ක්‍රම විවිධ ස්වරූපයෙන් ක්‍රියාත්මක කෙරේ.

### චක්‍රීය ණය යෝජනා ක්‍රම

චක්‍රීය ණය යෝජනා ක්‍රමය යටතේ, පවතින අරමුදල් ණය ඉල්ලුම්කරුවන්ට ලබා දෙන අතර ආපසු අය කරගත් මුදල් නැවත අරමුදලට යෙදවේ. එම මුදල් යොදාගනිමින් නැවත වෙනත් ණය ඉල්ලුම්කරුවන්ට ලබා දෙමින් චක්‍රීය ආකාරයෙන් මෙම ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක වේ. නිදසුන් (තේ සංවර්ධන චක්‍රීය අරමුදල් ණය ව්‍යාපෘතිය (TDPRF), දිළිඳුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය චක්‍රීය අරමුදල අදියර I සහ අදියර II.

### ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම

ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් තම අරමුදල්වලින් ණය ඉල්ලුම්කරුවන් වෙත ණය ලබා දෙන අතර එම ලබා දුන් ණය මුදල ශ්‍රී ලංකා මහ බැංකුවේ අදාළ අරමුදලෙන් නැවත අය කර ගනු ලැබේ. මෙහි දී, මූල්‍ය ආයතනවලට අය කර ගත හැකි උපරිම පොලී සීමාව ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කරයි. සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් එම පොලිය ද සමඟ ණය වාරික මාසික ව අය කර ගනී. මාස 06කට වරක් සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ණය ගැනුම්කරුගෙන් ආපසු අය කර ගන්නා ණය මුදල මහ බැංකුවට යම් කිසි පොලී ප්‍රතිශතයක් සමඟ ආපසු ගෙවිය යුතු වේ. නිදසුන් ලෙස සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය දැක්විය හැකි අතර මෙහි දී සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් මහ බැංකුවට ගෙවිය යුතු පොලී අනුපාතය සියයට 3කි.

### ණය ඇප ආවරණ යෝජනා ක්‍රම

මෙම ණය යෝජනා ක්‍රම යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතන මගින් ණය ලබා දුන් පසු යම්කිසි සාධාරණ පිළිගත හැකි හේතුවක් මත එම ණය ආපසු අය කර ගැනීමට නො හැකි වන අවස්ථාවල දී එම නො ගෙවන මුදල් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙවීමට ඇප වෙයි. එ සේ ගෙවීම් කිරීමට මූල්‍ය ආයතනය අදාළ ණය ගැනුම්කරුවාට එරෙහි ව නීතිමය ක්‍රියා මාර්ග ගැනීම ආරම්භ කර තිබිය යුතු ය. මෙ සේ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අදාළ ණය පියවීමෙන් පසු ව යම් මුදලක් එම ණය සම්බන්ධයෙන් අදාළ ආයතනයට ලද හොත් එය ශ්‍රී ලංකා මහ බැංකුවට ආපසු ලබා දිය යුතු වේ.

නිදසුන් : තේ සංවර්ධන චක්‍රීය අරමුදල් ණය ව්‍යාපෘතිය, නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය

### ණය පොලී සහනාධාර යෝජනා ක්‍රම

මෙම යෝජනා ක්‍රමය යටතේ ණය ඉල්ලුම්කරුවන්ට අඩු පොලියට ණය ලබා දීමට අපේක්ෂිත ය. මෙහි දී සහභාගීත්ව මූල්‍ය ආයතන සාමාන්‍ය පොලී අනුපාතයට වඩා අඩු පොලියකට ණය ඉල්ලුම්කරුවන්ට ණය ලබා දෙන අතර සාමාන්‍ය පොලී අනුපාතය හා ණය ලබා දෙන ලද පොලී අනුපාතය අතර වෙනස ශ්‍රී ලංකා මහ බැංකුව මගින් මූල්‍ය ආයතනයට ගෙවනු ලැබේ.

නිදසුන් : මහා පරිමාණ කිරි නිෂ්පාදන ණය යෝජනා ක්‍රමය, තේ කර්මාන්තශාලා සඳහා කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය

3 වැනි වගුව

## ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ක්‍රියාත්මක කෙරෙන ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම හා ණය සහතික කිරීමේ යෝජනා ක්‍රම

| ණය යෝජනා ක්‍රමයේ නම | පොලී අනුපාතය | උපරිම ණය සීමාව (රුපියල්) | කාල - පරිච්ඡේදය | අරමුණ |
|---|---|---|---|---|
| නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (NCRCS) | 7.00% | 504,000/- | මාස 07 | සුළු පරිමාණ ගොවීන් සඳහා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සම්පාදනය<br>▪ කෙටි කාලීන නිෂ්පාදන ණය<br>▪ ඉදිරි වෙළෙඳ ගිවිසුම් මගින් කෘෂි කාර්මික පරිභෝජන භාණ්ඩ මිල දී ගැනීම |
| තේ සංවර්ධන චක්‍රීය අරමුදල් ණය ව්‍යාපෘතිය (TDPRF) | 9.00% | 1,500,000/- | නිශ්චිත නැත | සුළු පරිමාණ තේ වගාකරුවන්ගේ ආදායම් වර්ධනය සහ අපනයන තත්ත්වයේ නිෂ්පාදන ප්‍රවර්ධනය උදෙසා යටිතල පහසුකම් වර්ධනය |
| මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය | 6.00% | 25,000,000/- | වර්ෂ 05 යි | දේශීය කිරි නිෂ්පාදනය වර්ධනය සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම |
| ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමය - SEPI | 7.00% | 500,000/- | වර්ෂ 04 යි | පිළිගත් වෘත්තීය පුහුණු ආයතනවලින් පුහුණුව ලැබූ තරුණ පිරිස් සඳහා එම වෘත්තීය පුහුණුව හා බැඳුණු ස්වයං රැකියා ආරම්භ කිරීමට අරමුදල් සම්පාදනය කිරීම |
| තේ කර්මාන්තශාලා සඳහා කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය | භරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතය (WAPLR) + 1.0% - 2.0% | 2015 ප්‍රථම කාර්තුවේ කර්මාන්ත ශාලාවේ භරිත සාමාන්‍ය පිරිවැටුම මත පදනම් ව මසක් සඳහා වන කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව | වර්ෂ 05 යි | ලියාපදිංචි කරන ලද තේ කර්මාන්ත සඳහා අවශ්‍ය කාරක ප්‍රාග්ධනය සපයා ගැනීමට සහය වීම |
| තරුණ දිරිය ණය යෝජනා ක්‍රමය | 6.5% | 150,000/- | වර්ෂ 03 යි | සුළු පරිමාණ ව්‍යාපාර සහ ස්වයං රැකියා ව්‍යාපෘති සඳහා ණය පහසුකම් ලබා දීම මගින් ග්‍රාමීය තරුණ ප්‍රජාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම |
| දිළිඳුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය චක්‍රීය අරමුදල | 12.00% | පළමු ණය - 100,000<br>දෙවන ණය - 150,000<br>තෙවන ණය - 200,000 | වර්ෂ 03යි | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය සහ විධිමත් බැංකු අංශය හා සම්බන්ධ වීම සඳහා අඩු ආදායම්ලාභී කණ්ඩායම් සංවිධානය කිරීම මගින් දිළිඳු බව පිටු දැකීම |
| දිළිඳුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය චක්‍රීය අරමුදල - අදියර II | 10.00% | | | |
| ස්වශක්ති ණය යෝජනා ක්‍රමය | 5.50% | 250,000/- | වර්ෂ 05යි | රට පුරා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සංවර්ධනය කර රැකියා මිලියනයක් බිහි කිරීම |
| සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය | 8.00% | 25,000,000/- | වර්ෂ 05යි | නවෝත්පාදන, නව රැකියා අවස්ථා ජනනය කරන සුළු හා මාධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ ව්‍යාපෘති මූල්‍යකරණයට අරමුදල් සැපයීම |

මූලාශ්‍රයඃ ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව - 2016

### නිපුණතා සංවර්ධන හා තාක්ෂණ හුවමාරු වැඩසටහන් තුළින් කුසලතා වර්ධනය

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් මුහුණ පා ඇති ප්‍රධානතම දුෂ්කරතා වන තාක්ෂණික හා කළමනාකාරීත්ව නිපුණතාවල දුර්වලතාවලින් ඔවුන් මග හරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දිවයින පුරා ප්‍රාදේශීය මට්ටමින් විවිධ තාක්ෂණික හුවමාරු වැඩසටහන් හා නිපුණතා සංවර්ධන වැඩසටහන් තෝරාගත් ව්‍යවසායකයින් සඳහා ක්‍රියාත්මක කරනු ලබයි. මෙම වැඩසටහන් මෙහෙයවීම සඳහා තාක්ෂණික සහය හා සම්පත් දයකත්වය ශ්‍රී ලංකාවේ ප්‍රකට රාජ්‍ය හා පුද්ගලික ආයතන මගින් ලබා ගනී. 2016 වසර තුළ කෘෂිකාර්මික, සත්ව නිෂ්පාදන, ධීවර හා මත්ස්‍ය නිෂ්පාදන, දෙමුහුම් බීජ නිෂ්පාදනය, කාබනික හා කෘෂි රසායන, මැහුම්, මැටි ආශ්‍රිත නිෂ්පාදන, LED තාක්ෂණය, ෆයිබර් තාක්ෂණය වැනි විවිධ ක්ෂේත්‍ර ඔස්සේ පුහුණු වැඩසටහන් 180කට අධික ප්‍රමාණයක් පවත්වා ඇති අතර ව්‍යවසායකයින් 8,000කට ආසන්න පිරිසක් මෙම වැඩසටහන් සඳහා සහභාගී වී ඇත.

### වෙළෙඳ ප්‍රදර්ශන හා අලෙවිසල් තුළින් ව්‍යාපාර ප්‍රවර්ධනය

වෙළෙඳපොළ ප්‍රවේශය, ඕනෑ ම ව්‍යාපාර ක්ෂේත්‍රයක ප්‍රධානතම අභියෝගයකි. මෙම අභියෝගයට පිළියමක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සඳහා වෙළෙඳ ප්‍රදර්ශන හා අලෙවිසල් පැවැත්වීමට කටයුතු කරයි. මෙ මගින් ඔවුන්ට තම භාණ්ඩ අලෙවිය වැඩි කර ගැනීමට මෙන් ම තම භාණ්ඩ ප්‍රවර්ධනය කර ගැනීමට හා තම වෙළෙඳ සන්නාමය පාරිභෝගිකයන් අතර ප්‍රචලිත කර ගැනීමට අවස්ථාව උදා වී ඇත.

## ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා පවතින අභියෝග

### මූල්‍ය දුෂ්කරතා

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ප්‍රධාන මූල්‍ය සම්පාදන මාර්ග වන්නේ වාණිජ බැංකු, සංවර්ධන බැංකු හා සමූපකාර සමිති මගින් ලබා දෙන ණය පහසුකම් ය. නමුත්, සංවර්ධනය වෙමින් පවතින බොහෝ රටවල මෙන් ම ශ්‍රී ලංකාවේ ද වාණිජ බැංකු විසින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා මූල්‍ය පහසුකම් සැපයීම සම්බන්ධයෙන් යම් මැලිකමක් දක්වයි. විශේෂයෙන් ම ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය දීම මන්දගාමී වීමට බලපාඇති මූලික කරුණු පහතින් දක්වා ඇත.

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ගේ ව්‍යාපාර සැලසුම් වෙළෙඳපොළ පිළිබඳ අධි තක්සේරුවක් සහිත වූ දැක්මකින් සකස් කර තිබීම
- ශක්‍යතා අධ්‍යයන අසම්පූර්ණ වීම හා වෙළෙඳපොළ සමීක්ෂණ හා තාක්ෂණික අධ්‍යයනයන් දුර්වල වීම
- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය අධික අවදානමකින් යුක්ත වීම
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් ණය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ඇප සුරැකුම්පත් ප්‍රමාණවත් නො වීම
- බැංකු හා මූල්‍ය ආයතන විසින් ණය ලබාදීමේ දී ඇප සුරැකුම් මත හැර, ව්‍යාපෘති යෝජනාවන්ගේ ශක්‍යතාව පදනම් කරගනිමින් ණය ලබාදීමට මැලිකමක් දැක්වීම

ශ්‍රී ලංකාව පිළිබඳ අධ්‍යයනයේ දී ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ක්ෂුද්‍ර හා සුළු පරිමාණ ව්‍යාපාරවලට විශේෂ මූල්‍ය වැඩසටහන් රාශියක් පැවතිය ද මධ්‍ය හා දිගුකාලීන ණය යෝජනා ක්‍රම ප්‍රමාණවත් නො වීම හේතුවෙන් මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට තම ව්‍යාපාර පුළුල් කිරීම දුෂ්කර වී ඇත. මීට අමතර ව ප්‍රධාන සංවර්ධන බැංකු පිහිටුවා ඇත්තේ නාගරික ප්‍රදේශවල බැවින් දුෂ්කර ප්‍රදේශවල ව්‍යාපාරිකයන්ට මූල්‍ය පහසුකම් ලබා ගැනීම අභියෝගයක් වී ඇත.

### තාක්ෂණික දුෂ්කරතා


කළමනාකරණ නිපුණතා ප්‍රමාණවත් පරිදි නො පැවතීම මෙ රට සුළු පරිමාණ ව්‍යාපාර මුහුණ දෙන තවත් ප්‍රධාන අභියෝගයකි. ව්‍යාපාරයක් සාර්ථක වීමට බලපාන ප්‍රධාන සාධකයක් ලෙස කළමනාකරණ නිපුණතා දැක්විය හැකි අතර සුළු පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වය තීරණය වීමට ද එකී ව්‍යාපාර හිමිකරු සතු ව පවතින කළමනාකරණ නිපුණතා හා හැකියාවන් බලපායි.

එ මෙන් ම ව්‍යාපාර විසින් භාවිත කරනු ලබන යල් පැන ගිය හා අකාර්යක්ෂම තාක්ෂණික මෙවලම් හේතුවෙන් නිෂ්පාදන හෝ සේවා හෝ සැපයීමේ ක්‍රියාවලියේ ඵලදායිතාව අඩුවීම, භාණ්ඩ හා සේවාවල ගුණාත්මකභාවය පිරිහීම හා නිෂ්පාදිත භාණ්ඩ ප්‍රතික්ෂේප වීම ඉහළ යෑම වැනි ගැටලු ද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මුහුණ දෙන අනෙකුත් අභියෝග වේ. මෙ වැනි හේතු නිසා නිෂ්පාදිතවල ඒකක පිරිවැය ඉහළ ගොස් වෙළෙඳපොළ තරගකාරීත්වයට මුහුණ දීමට නො හැකි තත්ත්වයක් ඇති වේ.


තව ද, ව්‍යාපාරිකයන් නවීන තාක්ෂණික ක්‍රමෝපායයන්ගේ පිරිවැය ඉහළ බැවින් ඒවා භාවිතයට ගැනීමට දක්වන මැලිකම හේතුවෙන් තරගකාරී ලෙස තම ව්‍යාපාර පවත්වා ගෙන යෑමට නො හැකි වී ඇත. විශේෂයෙන් ම පාරම්පරික ව්‍යාපාර ක්ෂේත්‍ර තුළ තම මුතුන්මිත්තන්ගෙන් පැවත එන ශිල්ප ක්‍රමවලින් බැහැර වීමට දක්වන අකමැත්ත හේතුවෙන් වත්මන් තරගකාරී වෙළෙඳපොළ තුළ ඔවුන්ගේ නිෂ්පාදන පහත වැටීමක් ද සිදු ව ඇත.

2 වැනි රූප සටහන

**මූල්‍ය ආයතනවල දෘෂ්ටිකෝණය අනුව ඇති අභියෝග**




**ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ගේ දෘෂ්ටිකෝණය අනුව ඇති අභියෝග**



## ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය තවදුරටත් සාර්ථක කර ගැනීමට...

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඇතුළු සියලු ම ව්‍යාපාරවල වර්ධනයට හා ව්‍යාප්තියට ඒවා ක්‍රියාත්මක වන ආර්ථික, දේශපාලනික හා ව්‍යාපාර පරිසරය බලපායි. එම නිසා සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ ස්ථාවරත්වය ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල වර්ධනයට හා නගාසිටුවීමට බෙහෙවින් ඉවහල් වේ. එ බැවින් ප්‍රථමයෙන් සඳහන් කළ පරිදි ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනයට බලපාන ප්‍රධාන සාධක වනුයේ නිපුණතා වර්ධනය, ව්‍යාපාර පවත්වාගෙන යෑමේ පිරිවැය අවම කිරීම, ව්‍යාපාර සඳහා වන අධික පිරිවැයක් දැරිය යුතු වන හා කල් ගත වන නීති සහ රෙගුලාසි අවම කිරීම, බුද්ධිමය දේපළ සුරැකීම, හා ව්‍යාපාර පුළුල් කිරීම සඳහා වන නීතිමය රාමුව පුළුල් කිරීම ආදියයි.

එ මෙන් ම, මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් ව්‍යාපාර බිඳවැටීම් වැළැක්වීම සඳහා ව්‍යාපාරවලට කෙටිකාලීන කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීමට සුදුසු ණය යෝජනා ක්‍රම හඳුන්වාදීම, ග්‍රාමීය මට්ටමින් පවතින රාජ්‍ය නො වන සංවිධාන හා ණය කරුවන් සම්බන්ධ කර ගනිමින් ග්‍රාමීය වශයෙන් ණය ලබා දීම සඳහා වාණිජ බැංකු දිරිමත් කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙල සකස්කිරීම මගින් ණය නැවත අය කර ගැනීම ඉහළ නංවා ගැනීමට හා ණය ග්‍රාමීය මට්ටම කරා ගලා යෑම වඩා කාර්යක්ෂම කිරීමට හැකි වීම, වාණිජ බැංකු සඳහා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය ව්‍යාපාරවලට ලබාදිය යුතු ණය පිළිබඳ අවම සීමාවක් පිළිබඳ ව විධාන නිකුත් කිරීම මගින් එම ව්‍යාපාරවලට ලැබෙන මූල්‍යමය පහසුකම් වර්ධනය වීමට සැලැස්වීම වැනි පියවර ගත යුතු ය. එ මෙන් ම කළමනාකාරීත්ව නිපුණතා, ව්‍යවසායකත්ව කුසලතා වර්ධනය සඳහා පවත්වන වැඩසටහන් සඳහා විශේෂ ණය යෝජනා ක්‍රම යටතේ වාණිජ හා විශේෂිත බැංකු මගින් ණය ලබා ගත් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සම්බන්ධ වීම අනිවාර්ය කිරීම තුළින් ඔවුන්ගේ කළමනාකරණ කුසලතා වර්ධනය කිරීමේ හැකියාවක් ඇත.

අවසාන වශයෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනයට පියවර රාශියක් ගෙන ඇති අතර අනෙකුත් බලධාරී අයතන හා සම්බන්ධතා වර්ධනය තුළින් දැනට ක්‍රියාත්මක වැඩසටහන්වල ඵලදායිතාව තවදුරටත් ඉහළ නංවා ගැනීමේ හැකියාවක් පවතී. තව ද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වර්ධනයෙහිලා ශ්‍රී ලංකා මහ බැංකුවේ ඍජු දායකත්වය ආර්ථිකයේ සමස්ත වර්ධනයට ද බෙහෙවින් ඉවහල් වන බව සඳහන් කළ හැකි ය.

**ආශ්‍රිත ග්‍රන්ථ:**


- ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව - 2016
- Contribution of ASEAN-6 SMEs to Economic Growth of ASEAN - BadarAlam Iqbal, MohdNayyer Rahman Aligarh Muslim University, Aligarh (UP), India
- Global value chains in a changing world - by Deborah K. Elms and Patrick Low - World Trade Organization
- MSME Definition in India (The Present State and the Imperatives by Dr.P.M.Mathew)
- Role of the Central Bank in Promoting Small Scale Enterprises in the SEACEN Countries - DagvaBoldbaatar
- SME Internationalization and Finance in Asia - Naoyuki Yoshino & GaneshanWignaraja - Asian Development Bank



මහ බැංකු වෙබ් අඩවිය නව මුහුණුවරකින්



www.cbsl.gov.lk

සන්නිවේදන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, නො. 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව.

011 - 2477418 011 - 2346304 dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# සිතා මතා විකෘති කරන ලද මුදල් නෝට්ටු හඳුනා ගනිමු

## සිතා මතා අඳින ලද

රූප, වචන, ඉලක්කම්, අත්සන් හෝ
සංකේත මගින් මුදල් නෝට්ටුවේ අනුක්‍රමික
අංකය, දිනය, අත්සන්, වටිනාකම හෝ
මුදල් නෝට්ටුවේ ආරක්ෂණ සලකුණු
සැලකිය යුතු ආකාරයකින් වෙනස් කර
ඇති මුදල් නෝට්ටු

**ගනු දෙනු සඳහා සුදුසු නොවේ.**










## අත්වැරදීමකින්

කුඩා තිතක් /ඉරක් ඇඳි
මුදල් නෝට්ටු

**ගනුදෙනු සඳහා සුදුසු වේ.**







ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, 30, ජනාධිපති මාවත, කොළඹ 1
දුරකථනය: +94 112477253 ෆැක්ස්: +94 112477726 ඊ මේල්: currency@cbsl.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA